# එක් ජාතියක් එක් දේශයක් එක් දැක්මක්

## ONE NATION ONE STATE ONE VISION



ශ්‍රී ගුණසිංහ

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය

## NATIONAL REPUBLICAN PARTY OF SRI LANKA

## SLNRP

**නව දේශපාලන දර්ශනයක් මගින් අලුත් උත්පත්තියක් ලබමු**

**HAVE A NEW BIRTH THROUGH A FRESH POLITICAL VISION**

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
# (SLNRP)

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය
# Sri Lanka National Republican Party
# (SLNRP)

ශ්‍රේ ගුණසිංහ

" අපගේ ජාතිය මනුෂ්‍ය ජාතිය යි

අපගේ ධර්මය මනුෂ්‍ය ධර්මය යි

අපගේ පක්ෂය මනුෂ්‍ය පක්ෂය යි

අපගේ දර්ශනය මනුෂ්‍ය දර්ශනය යි

අපගේ දේශපාලනය මනුෂ්‍යත්වය සඳහාම යි

දේශපාලනයේදී ජාති ආගම් කුලමල උස් මිටිකම් අපි නොතකමු "

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය පිහිටුවීම
## ESTABLSHMENT OF SRI LANKA NATIONAL REPUBLICAN PARTY (SLNRP)

| | | |
|---|---|---|
| **සංවිධානයේ නම** | : | ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය |
| **පක්ෂ ලාංඡනය** | : | බඹරය |
| **මූලස්ථානය** | : | කොළඹ |
| **ආරම්භක දිනය** | : | 2005 ජනවාරි මස 03 වන දින |
| **දුරකථන අංකය** | : | 076 53 53 53 7 / 071 564 88 69 |
| **ෆැක්ස් අංකය** | : | 011 22 83 658 |
| **ඊ මේල් ලිපිනය** | : | info@slnrp.com |
| **වෙබ් ලිපිනය** | : | www.slnrp.com |
| **මාධ්‍යය** | : | සිංහල , දමිළ , ඉංග්‍රීසි |
| **නිර්මාතෘ** | : | ශ්‍රේ ගුණසිංහ |

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
**(SLNRP)**

## <u>තේමා ගීතය</u>

මේ අපේ පුංචි දිවයිනයි

මේ මගේ උදාර දේශයයි //

එඩිතර දූ පුතුන් සිටිනා මේ අපි උපන් මව් බිමයි

අපි වෙමු එක්සත් ශ්‍රී ලාංකිකයෝ මේ පුංචි දිවයිනේ

හදමු හදමු ගොඩ නගමු නගමු අපේ ජාතික ශ්‍රී ලංකා

නැති කරලමු මේ දුගී දුප්පත් අසරණකම අභිමානවත් ජාතියක් සේ ලංකා

බලමු බලමු අපි දකිමු දකිමු අද දින සුරම්‍ය වූ ලංකා

හැදෙමු වැඩෙමු අපි එක් ජාතියක් එක් දේශයක් සේ ලංකා

සිංහල දෙමළ මුස්ලිම් බර්ගර් මැලේ අප නැත භේදේ

බෞද්ධ ක්‍රිස්තියානි හින්දු මුස්ලිම් අප නැත භේදේ

වෙද ගුරු ගොවි කම්කරු සියලු වෘත්තීක අප නැත භේදේ

දුරලමු සියලුම වාද භේද අපේ රැකුමට මේ මනුෂ්‍ය නාමේ

උදවු කරමු අපි තවත් දේශයකට ගොඩනැගුමට අපි වාගේ

දෙමු අපි කාටත් පරමාදර්ශය වීමට දිනවන ශ්‍රී ලංකා

සතුටු වෙමු අපි සතුටු වෙමු අපි ගයමින් අපේ ජය ගීතේ

පද රචනය : ශ්‍රේ ගුණසිංහ

# පිළිගැන්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය කළ සියලුම දේශපාලන හා රාජ්‍ය සේවකයන්ගේ අදූරදර්ශී දේශපාලන ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් හේතුකොටගෙන කර කියාගත දෙයක් නොමැතිව අසරණ වූ දේශප්‍රේමී ජනතාවට මෙන්ම, ඒ හේතුවෙන් රට ජාතිය වෙනුවෙන් ජීවිතය පරදුවට තබා සටන් කර ශ්‍රී ලාංකේය දේශය හා ජාතිය ආරක්ෂා කර රැකදුන් අභීත ජනනායකයන්ට හා රණවිරුවන්ට මෙම නව දේශපාලන දර්ශනය උපහාරයක් වේවා !

තව දුරටත් ශ්‍රී ලංකා දේශය සමෘද්ධිය හා සෞභාග්‍යයකරා ගෙනයාමට උරදුන් හා උරදෙමින් සිටින සියලුම දේශප්‍රේමී බලවේගයන්ට හා රටේ ආදරණීය බුද්ධිමත් ඡන්ද දායකයන්ට මෙන්ම, ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවට එරෙහි අභියෝගයන්ට මුහුණ දෙමින් රටේ සංවර්ධනයට හා දියුණුව වෙනුවෙන් සහයෝගය දුන් සියලුම ජාත්‍යන්තර හා දේශීය සංවිධානවලට, හා දහඩිය මහන්සියෙන් ශ්‍රී ලංකා ආර්ථිකය ගොඩනැගීමට උරදෙන බදු ගෙවන ජනතාවට මෙන්ම විදේශ විනිමය උපයමින් සේවයේ යෙදෙන ආදරණීය ජනතාවට ද මෙම දේශපාලන සංකල්පය උපහාරයක්ම වේවා !

අතීතයේ සිට වර්තමානය දක්වා (රජාණ්ඩු පාලනය , අධිරාජ්‍යවාදී පාලනය හා වර්තමාන දේශපාලන ක්‍රමය) පැවතුණු සියලුම දේශපාලන ක්‍රමයන් ශ්‍රී ලංකා දේශපාලන, ආර්ථික , සාමාජීය ක්‍රමයට නොගැළපෙන හා එහි පරිවර්තනයක් සිදුවිය යුතු යැයි හඬ නගපු හා ඊට එරෙහිව සටන් කළ ජාතික වීරවරයන්ට හා එම අදහස් උද්දීපනය කරමින් රටට ස්ථාවර නව දේශපාලන ප්‍රතිපත්තියක් අවශ්‍ය බව ප්‍රකාශ කළ රටේ බුද්ධිමත් උගත් ජනතාවට හා එම අදහස් පොදු මාධ්‍ය ඔස්සේ සන්නිවේදනය කරමින් දේශප්‍රේමීන් අවදිකළ සියලුම ජනමාධ්‍ය ආයතන වලට හා ගෞරවණීය මාධ්‍ය කරුවන්ට මෙන්ම මා උනන්දු කළ රටේ පොදු ජනතාවටද මෙම අභියෝගාත්මක, පෙරළිකාර ආර්ථීක, සමාජීය, පරිණත දේශපාලන සංකල්පය ඉතා ආදරයෙන් පිළිගන්වමි.

# ස්තුතිය

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය නිර්මාණය කිරීමේදී ඊට දායක වූ පිරිස ඉතා බොහෝය. ඔවුන් අතරින් විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, කථිකාචාර්යවරුන් මෙන්ම විශ්වවිද්‍යාල සිසුන්, වෘත්තිකයන්, රාජ්‍ය නිළධාරින්, සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්, ගොවි මහතුන්, කම්කරු මහතුන්, බෞද්ධ, කතෝලික, හින්දු, මුස්ලිම්, පූජක වරුන් මෙන්ම සෑම ජාතිකයටම අයත් පුරවැසියන් යන සියළු දෙනාගේම අදහස්, අපේක්ෂාවන් හා ප්‍රකාශන මෙම නව දේශපාලන නිර්මාණයේදී බොහෝ සේ දායක කරගන්නා ලදී.

මෙම කර්තව්‍ය දේශපාලන නිර්මාණයක් වන හෙයින් මෙයට දායක වූ පිරිසගේ නම් ගම් ප්‍රසිද්ධ කිරීමෙන් වැලකී සිටීමට උත්සහ දරණ අතර අඩුවැඩි වශයෙන් හා නන් අයුරෙන් සහයෝගය දැක්වූ ඒ සැමට ප්‍රථමයෙන් ස්තුතිය පුදකර සිටිමි.

තවද මෙම නව දේශපාලන නිර්මාණය පරිගණකගත කිරීමේ සිට මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් හා භෂා පරිවර්ථනයෙන් දායක වූ හා 2020 පළාත් හා දිස්ත්‍රික්ක සිතියම් නිර්මාණය කිරීමේදි දායක වූ සියළුම ශ්‍රම දායක මහත්ම මහත්මීන්ට ස්තුතිය පුදකර සිටින අතර මෙම දැවැන්ත දේශපාලන නිර්මාණය සඳහා වෙබ් අඩවිය සකස්කර දීමෙන් දායකවූ හා තේමා ගීතය සංගීතවත්කර ගායනය කිරීමෙන් දායක වූ සියළුම කලාකරුවන්ටද, වසර ගනණාවක් තිස්සේ නව දේශපාලන සංකල්පයක් රටට හඳුන්වා දීමට මා ධෛර්යවත් කරමින් අනුසාසනා හා උපදෙස් ලබාදුන් සියළුම ගෞරවනීය පූජ්‍ය හා ගිහි පිරිසටද, මා පිළිබඳව විශවාසය තබමින් මා සමඟ වසර ගනණාවක් ගනුදෙනු කළ සියළුම සේවාදායකයින්ට හා හිතමිතුරන්ට මාගේ අවංක ආදර ස්තුතිය මෙහිදී පුදකර සිටිමි.

# පෙළගැසුම


| | පිටුව |
|---|---|
| SLNRP සටන් පාඨය | ii |
| SLNRP පිහිටුවීම | iii |
| SLNRP තේමා ගීතය | iv |
| පිළිගැන්වීම | v |
| ස්තුතිය | vii |
| පෙළගැසුම | viii |
| SLNRP හැඳින්වීම | 01 - 04 |
| SLNRP පදනම හා පරමාර්ථය | 05 - 07 |
| SLNRP අරමුණු හා ඉලක්ක | 08 - 09 |
| SLNRP දේශපාලන ඉලක්ක හා අරමුණු සපුරා ගැනීමට යෝජනා | 10 - 13 |
| නව පළාත් හා නව දිස්ත්‍රික්ක ස්ථාපිත කිරීමේ යෝජනාව | 14 - 17 |
| 2020 නව පළාත් සිතියම | 18 |
| 2020 නව දිස්ත්‍රික් සිතියම | 19 |
| යෝජිත අමාත්‍යාංශ හා අමාත්‍ය මණ්ඩලය | 20 |
| <u>SLNRP ක්‍රියාකාරීත්වය</u> | |
| SLNRP සාමාජිකත්වය ලබාදීම | 21 |
| SLNRP නිලධාරීන් පත්කිරීම | 21 |
| SLNRP රැස්වීම් පැවැත්වීම | 21 - 22 |
| SLNRP සාමාජික මුදල් | 22 |
| SLNRP සංවිධානය නමින් අරමුදලක් පිහිටුවීම | 22 |
| SLNRP නිලධාරීන්ගේ සේවා කාලය | 23 |
| SLNRP ක්‍රියාකාරී මණ්ඩල පත්කිරීම | 23 - 24 |
| SLNRP විසුරුවා හැරීම | 24 |
| SLNRP සාමාජිකත්වය | 25 - 27 |
| SLNRP සාමාජිකත්ව අයදුම් පත්‍රය | 28 |
| ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය නිර්මාතෘ | 29 - 37 |
| ජේ. ඊ. ගුණසිංහයන්ගේ දේශපාලන ආගමනයේ මතක සටහන් | 38 - 41 |
| ශ්‍රී ලංකාව තුළ පළාත් හා දිස්ත්‍රික්ක මායිම් ස්ථාපනය කිරීම | 42 - 43 |
| වර්තමානයේ පළාත් හා දිස්ත්‍රික් බෙදා ක්‍රියාත්මකවන සිතියම | 44 |
| 1833 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ ආදායම් හා පරිපාලන සිතියම | 45 |
| කෝල්බෲක් වාර්තා සමඟ ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ පළාත් බෙදීම් සිතියම | 46 |
| ශ්‍රී ලංකාවේ උඩරට රාජධානි සමයේ පළාත් බෙදීම් සිතියම | 47 |
| ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය විචාරණය කිරීම | 48 - 51 |
| සටහන් | 52 - 53 |

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය
# Sri Lanka National Republican Party
# (SLNRP)

## හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය නිර්මාණය කිරීමට හේතු වූ කරුණු පිළිබඳව මුලින්ම ඔබව (ජනතාව) දැනුවත් කළ යුතුය යැයි යනු මාගේ පෞද්ගලික හැඟීම හා යුතුකම යි.

ශ්‍රී ලාංකික ජනතාවට සර්වජන ඡන්ද බලය (වර්ෂ 1831) ලැබී වර්ෂ ගණනාවක් ගතවී ඇත. එදා සිට අද දක්වා ශ්‍රී ලාංකික ජනතාව ඔවුන්ගේ ඡන්දයෙන් ගම් මට්ටමින්, නගර මට්ටමින් විවිධ නායකයන් පාර්ලිමේන්තුවටත්, විධායකයටත් තෝරා පත්කර හැරියෝ ය. ඔවුන් අතරින් ශ්‍රේෂ්ඨ ජන නායකයෝ බිහි වූහ. ඔවුහු සියලු දෙනාම තම දේශපාලන කටයුතු මෙහෙයවූයේ හුදෙක්ම ඒ ඒ වකවානුවල ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික, දේශපාලන, සමාජීය ගැටලු හා ප්‍රශ්න වලට විවිධ වූ විසඳුම් සොයා ගැනීමටය. එම විසඳුම් කෙටි කාලීනව හා දිගු කාලීන වශයෙන් සමාජයේ ජීවත්වන සෑම ජන කොටසකටම ආගම්, ජාති, කුල, පංති භේදයකින් තොරව හොඳට හා නරකට ද ප්‍රතිඵල ගෙනදුන්නේ ය.

ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජීය අංශයන් කෙරෙහි ඉතා සියුම්ව කරන ලද නිරීක්ෂණ හා පර්යේෂණ, ගවේෂණාත්මකව ආපසු හැරී බැලීමක් සිදු කළේ නම් කාටත් සක්සුදක් සේ පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික අප සියලු දෙනාම එකතැන පල්වන ජාතියක් බවට පත්වී ඇති බවයි. එනම් අප ජීවත් වන්නේ හැමදාමත්, කවදාවත් නොවිසිදුණු හා නොවිසඳෙන ප්‍රශ්න රාශියක් අතර නොවේද?

කුමක්ද මෙයට හේතුව?

එදා සිට අද දක්වා විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් ශ්‍රී ලාංකික ජනතාව හා සමාජය දෙස බලා විසඳුම් ඉදිරිපත් කළ විවිධ දේශපාලන පක්‍ෂවල අරමුණු ඉටුකර ගැනීමට ජනතාවගේ වටිනා ඡන්දය දී ඇති බව සැබෑය. මෙම පක්‍ෂවල අරමුණු දෙස අප හැරී බැලුවහොත් මෙතෙක් දුරට බිහිවුණු සෑම පක්ෂයක්ම සමස්තයක් හැටියට ගෙන විශ්ලේෂණය කිරීමේදී ගැබ්වී ඇත්තේ පටු දේශපාලන අරමුණු යැයි උගත් බුද්ධිමත් ලොකු කුඩා ඕනෑම පුරවැසියෙකුට තේරුම් ගැනීමට එතරම් අමාරු නැත.

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ පසුබිම දෙස හැරී බලනවා නම් යටත් විජිතකරණයේ සිට ශ්‍රී ලාංකික ජනතාවගේ විමුක්තිය උදෙසා කරනු ලැබූ අධිරාජ්‍ය විරෝධී අරගලයේ පටන් විවිධ ජනනායකයන් ශ්‍රී ලංකා මාතාව ජනතාවට දායාද කළා ය. වර්ෂ 1948 න් පසු ශ්‍රී ලාංකිය නායකයන් විවිධ දේශපාලන ක්‍රම හා න්‍යාය අනුගමනය කරමින් සමහරක් ධනවාදී දේශපාලන අරමුණු කරාද තව සමහරක් සමාජවාදි දේශපාලන අරමුණු කරාද, තවත් සමහරක් කොමියුනිස්ට්වාදී දේශපාලන අරමුණු කරාද තවත් සමහරක් පැසිස්ට්වාදී අරමුණු කරාද තවත් සමහරක් ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු කරාද මේ රට මෙහෙයවූයේ පොදු ජනතාවගේ ඡන්දය ඊට අවනතකර ලබාගැනීමෙන් ය.

ශ්‍රී ලංකාව වැනි බහු ජාතික, බහු ආගමික, විවිධ වූ සංස්කෘතීන් යටතේ ජීවත්වන ජන සමාජය හොඳින් හඳුනාගෙන මෙම දිවයින සමෘද්ධිමත් හා සෞභාග්‍යයවත් දේශයක් කරා මෙහෙය වීමට ඉතා පැහැදිලි දේශපාලන දර්ශනයක් අපේ මේ පුංචි දිවයිනට ලබාදිමට හැකිවුණේ කුමන දේශපාලන පක්ෂයකටද?............. නැත්නම් කුමන දේශපාලන නායකයකුටද?.............

අද ශ්‍රී ලංකාව තුළ බිහිවී ඇති සියලුම දේශපාලන පක්ෂ පිළිබඳව ඉතා විමර්ශනාත්මකව විශ්ලේෂණයක යෙදෙන්නේ නම් ඔවුන්ගේ පක්ෂ ප්‍රතිපත්ති කුමන අරමුණක වුවත් ඔවුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් මේ රටේ පොදු ජනතාවට ඉතා පැහැදිලිව දැකිය හැකිව තිබෙන්නේ හොරකම, වංචාව, අල්ලස, දූෂණය, ජාතික දැක්මක් නැතිකම, නිසි ප්‍රතිපත්තිමය දේශපාලන ක්‍රමයක් නොමැති වීම හා ජාතිභේද, ආගම් භේද, පංති භේද අවුස්සන ලක්ෂණ වේ. ඊට හේතුව හැටියට දකින්නේ, දේශපාලන නායකයෝ සමහරක් ඔවුන්ගේ ප්‍රදේශ පමණක් සංවර්ධනය මුල්කරගෙන තමන්ගේ දේශපාලන මතය හා අරමුණු ක්‍රියාවට නගන අතර තවත් සමහරෙක් ජාති වශයෙන්ද තවත් සමහරෙක් ආගම් වශයෙන්ද තවත් සමහරෙක් තම වත්කම් තරකර ගැනීමට ද, තවත් සමහරෙක් තම නෑ හිතමිතුරන් පෝෂණය කිරීමටද පොදු ජනතාවගෙන් පිනට ලැබුණු වරප්‍රසාදය (ඡන්දය) බුක්ති විඳිති.

තවත් දෘෂ්ටි කෝණයකින් වර්තමාන දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව විග්‍රහයක යෙදෙන්නේ නම් රටේ මහා ඡන්දයක් ඇතිවන අවස්ථාවකදී දේශපාලන වේදිකාවේ සිට හා විවිධ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ මෙම රටේ පවතින විවිධ වූ සමාජ, දේශපාලන හා ආර්ථික ගැටලු පිළිබඳ අදහස් පක්ෂ නායකයෝ ප්‍රකාශ කරති. ඒ වගේම ඔවුන් ජනතාව විසින් බලයට පත්කළහොත් රටේ පවතින ප්‍රශ්න විසඳීම සඳහා ඇති හැකියාව ගැන ඉතා ඉහළින් පොරොන්දු ලබා දෙති. මේ අනුව ඉතා උපක්‍රමශීලීව ජනතාවගේ ඡන්දය ලබා ගැනීමට කටයුතු කරති.

වර්තමාන දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ ජනතාවට හොඳ අවබෝධයක් ඇත. කුමන දේශපාලන පක්ෂය බලයට පත්වුවත්, කුමන දේශපාලන නායකයෙකු බලයට පත් කෙරුවත් ශ්‍රී ලාංකික ජනතාවට පොදුවේ පිළිගත හැකි දේශපාලන ප්‍රතිපත්තියක් හෝ දර්ශනයක් නොමැතිකම නිසා දේශපාලන නායකයන් පිළිබඳ විශ්වාසයක් ජනතාව තුළ අද නැති තරම් ය. එම නිසා ඔවුන් තවත් දේශපාලන නායකයෙකුට සාපේක්ෂව තමන්ට විශ්වාසයක් තැබිය හැකි පුද්ගලයෙකුට තම ඡන්ද මනාපය ලබා දීමට පෙළඹී ඇත. ඒ වගේම තවත් සමහරෙක් පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලබාගත හැකි පුද්ගලයෙකුට තම ඡන්ද මනාපය ලබා දීමට පෙළඹී ඇත. තවත් සමහරෙක් තම පවුලේ වැඩිහිටියන්ගේ පිළිගැනීම මතද තවත් සමහරෙක් තම හාම්පුතුන්ගේ වුවමනාව මතද තම ඡන්ද මනාපය ලබාදිය යුතු දේශපාලන පක්ෂය හෝ පුද්ගලයා තෝරා ගනිති. මේ අනුව සමස්තයක් ලෙස ගත් කළ තම ඡන්ද අයිතිය රටේ ප්‍රගමනය සඳහා පාවිච්චි කරන්නේ කීයෙන් කී දෙනාද? එහෙත් ඔවුන්ගේ අරමුණු වර්තමාන දේශපාලන භූමිය අධ්‍යයනය කිරීමේදී ඉටු වී තිබේද?

මේ තුළින් අද ශ්‍රී ලංකා ජනතාව භුක්ති විඳින වරප්‍රසාදය කුමක්ද?

ශ්‍රී ලාංකික ජනතාව ඔවුන්ගේ ඡන්ද බලයෙන් විවිධ කාලවල නායකත්වයට පත් කළ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් විධායකය, ව්‍යවස්ථාදායකය, හා අධිකරණ ක්‍රියාකාරීත්වය පිළිබඳ පවත්නා

විශ්වාසය පලුදු වී ඇති බව වර්තමාන දේශපාලන භූමිය නිරීක්ෂණය කරන බුද්ධිමතුන්ගේ මතය නොවන්නේද? එය පොදු ජනතාවගේ මතයද නොවන්නේද ?

එදා සිට අද දක්වා ශ්‍රී ලංකා දේශයේ පාලන බලයට පත්වූ සියලුම පක්‍ෂ හා එම දේශපාලන පක්‍ෂ නායකයන්ගේ සියලු දේශපාලන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල අද පොදු ජනතාව කාලානුරූපව භුක්ති විඳිමින් සිටිති. එසේ වුවත් එම නිසා කිසිම ජන නායකයෙකුට කිසිවිටකත් චෝදනා එල්ල කිරීමට නොහැකිය. මක්නිසාදයත් ඔවුන් සියලු දෙනාම කාලයත් සමඟ සටන් කර තම දේශපාලන මතය පොදු ජනතාවගේ කැමැත්ත (ඡන්ද මනාපය) මත ගොඩනගා ඇති නිසා ය.

පොදුවේ ගත්කල මේ රටේ ජීවත්වන බහුතර ජනතාව පවතින වර්තමාන දේශපාලන ක්‍රමය පිළිබඳ ඉතා කලකිරීමකින් කතා කරති. ඒ වගේම රටේ අනාගතය පිළිබඳ දැඩි අවිනිශ්චිත තත්ත්වයක් ප්‍රකාශ කරති. මේ අනුව රටේ උගත්, බුද්ධිමත් පිරිස රට හැරයාමට පෙළඹී ඇත. මෙම තත්ත්වය වෙනස් කිරීමට ජනතාවට වුවමනාව ඇතත් කාටද පුළුවන් පෙරමුණ ගෙන අද කටයුතු කිරීමට. මේ සඳහා දක්ෂ නායකයන් බිහිවීම අද ඉතා විරලය. ඒ තරමට මනුෂ්‍ය ජීවිතයේ පැවැත්ම අවිනිශ්චිතය.

මේ සඳහා අප පොදුවේ සංවිධානය විය යුතුව ඇත. මක්නිසාදයත් එදා පොදු ජනතාවගේ වටිනා ඡන්දය කුමන හෝ අරමුණක් මත ලබා දී පුද්ගලයන් රටේ පාලන බලයට පත්කෙරුවද, ඔවුන් විසින් කළ විවිධ දේශපාලන ක්‍රියාකාරකම් අදූරදර්ශිව රටේ විනාශය දක්වා බලය ලබාගත් කාලසීමාව තුළ ක්‍රියා කළත් ඔවුන්ට ඡන්දය දුන් ජනතාවට හා විරුද්ධ පක්ෂය ඇතුලුව අනෙකුත් දේශපාලන පක්ෂවලට කළ හැකි වූයේ කුමක්ද? මේ තත්ත්වය අද දක්වාම තට්ටු මාරුවෙන් මාරුවට ඉදිරියට පැමිණ ඇතත් එම තත්ත්වය පාලනය කිරීමට අපට නොහැකි වී ඇත්තේ පොදු දේශපාලන ප්‍රතිපත්තියක් හෝ දර්ශනයක් අපට නොමැති නිසාය.

එහි ප්‍රතිවිපාකයක් වශයෙන් නැවත ගොඩනැගීමට අද කාලය උදාවී ඇත. 2004 දෙසැම්බර් 26 සුනාමිය (Tsunami) දිය පහර විසින් නිදා සිටි ශ්‍රී ලාංකික ජනතාව අවදි කරන ලදී. අපට දැන් පක්‍ෂ, ආගම්, පංති, කුල භේදයකින් තොරව ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන් මග පිළිබඳව සියලු වාදභේදයන්ගෙන් තොරව සිතීමට කාලය පැමිණ ඇත.

එසේ නම් දැන් අපි කුමක් කරමු ද ? …………

බලාසිටිමු ද ?………. අවදිවෙමු ද ?………. ක්‍රියාත්මක වෙමු ද ?……….

නැති නම් කතා කරමින්ම හැමදාමත් බලා සිටිමු ද ?……

අද බොහෝ පක්‍ෂ, ආගම්, ජාතීන් හා වෘත්තිකයෝ මේ පිළිබඳව දැඩි ලෙස කතා කරති. එම කතාවන් තුළ කොතෙක් දුරට සත්‍යය හා වුවමනාව ගැබ්වී තිබෙනවාද යන්න කවුරුන්ට කිවහැකි ද ?

නැත්නම්, මේ සියලු ජන කොටස් ඒකරාශී කිරීමට හැකි බලවේගය කුමක් ද ?

ජනතාවට කවුරුන් විශ්වාස කළහැකි ද ?

එසේනම් කවුද  මේ සියලුම පක්‍ෂ, ජාති, ආගම් හා පංති භේදයෙන් තොරව ශ්‍රී ලංකාව තුළ වෙසෙන සෑම ජන කොට්ඨාසයකටම යුක්ති සාධාරණත්වය හා ලංකා මාතාව සමෘද්ධිය හා සෞභාග්‍යය කරා ගෙනයාමට පුළුවන් විස්මිත යන්ත්‍රණය මෙවැනිම තවත් දේශයන්ට ආදර්ශයක් වන අයුරින් හා ලෝකයේ සෑම රජයකින්ම සහයෝගය ලබාගත හැකි අයුරින් නිර්මාණශීලීව සැලසුම් කරන්නේ ????..........

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය නිර්මාණය කිරීමේදි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ ශ්‍රී ලංකාව මෙන්ම ලෝකයේ තවත් මෙවැනිම රාජ්‍යයන් ආර්ථික වශයෙන් මෙන්ම දේශපාලන වශයෙන් අස්ථාවර වීමට හේතු පිළිබඳවය. ඒ අනුව ශ්‍රී ලංකාව අස්ථාවර රාජ්‍යයක් වීමට අදාළ කරුණු ඉතා සියුම් ලෙස අධ්‍යයනය කරමින් ඔබගේ අවධානයට ඉතා සංක්ෂිප්තව මෙහිදී කරුණු ගෙනහැර දක්වන ලදි. එයින් අපේක්ෂා කරන ලද්දේ ශ්‍රී ලංකාව මෙන්ම ලෝකයේ දූෂිත දේශපාලන ක්‍රමය හේතුකොටගෙන පීඩනයට ලක්ව දුක්විඳින ජනතාවගේ දේශපාලන අපේක්ෂාවන් ඔවුන්ගේ සමාජීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හැඟීම් හා අදහස්වලට ගැලපෙන පරිදි අරමුණු ගොඩනගා ගනිමින් නිශ්චිත කාලරාමුවක් තුළ දේශපාලනික, ආර්ථික හා සමාජීය ඉලක්ක සපුරා ගැනීමට දේශපාලන ධාරාවක් නිර්මාණය කිරීම ය.

මෙම කර්තව්‍යයට ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය එළඹුණේ, පසුගිය වසර ගණනාවක් මුළුල්ලේ ලෝක දේශපානය මෙන්ම ශ්‍රී ලංකා දේශපාලන ධාරාව පිළිබඳව වර්ෂ 1948 දී ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලැබූ දින සිට පමණක් නොව එයින් ඔබ්බටද යටත් විජිතකරණයට ශ්‍රී ලංකාව හසු වූ කාල පරිච්ඡේදයත්, ඉන් ඔබ්බට ශ්‍රී ලංකාවේ රජකළ රජවරුන්ගේ පාලන සමයන් තුළද ශ්‍රී ලංකාවේ පැවතුණු දේශපාලනය, ආර්ථිකය, සමාජය හා සංස්කෘතිය පිළිබඳව ඉතා ගැඹුරින් කරන ලද සමාජ ගවේෂණ හා අධ්‍යයන රාශියක් මුල්කර ගනිමිනි. එම නිසා මෙම නව දේශපාලන නිර්මාණය යුගයට ගැළපෙන දූවැන්ත දේශපාලන දර්ශනයක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

මෙම නව දේශපාලන නිර්මාණය අරමුණු කරන්නා වූ දේශපාලන ඉලක්ක සපුරාගෙන ශ්‍රී ලංකා දිවයින තුළ වෙසෙන සියලුම ජනකොට්ඨාස සඳහා සියලුම වාද භේදයන් ගෙන් මිදී නිදහස්ව හා සුදුස්සාට සුදුසු තැන ලබා දී රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කරවීමේ හැකියාව ඇති කිරීමට ශ්‍රී ලාංකික බුද්ධිමත් ජනතාවට ශක්තිය, ධෛර්යය, වුවමනාව, උනන්දුව හා අධිෂ්ඨානය ප්‍රාර්ථනා කරමි.

ශ්‍රේ ගුණසිංහ

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## පදනම හා පරමාර්ථය

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය බිහිකිරීමට පදනම වූයේ, ශ්‍රී ලංකා දිවයින ක්‍රි:ව 1505 සිට වාණිජ පදනමක් මත විදේශ ආක්‍රමණයන්ට නතුවීමෙන් අනතුරුව මෙම දිවයින පාලනය වූයේ එම විදේශ රාජ්‍යයන් හි ප්‍රධාන වශයෙන් වාණිජ අරමුණු ඉටුකර ගැනීමේ කර්තව්‍ය පෙරදැරි කරගෙනය. ඒ අනුව ශ්‍රී ලාංකේය දිවයින ස්වර්ණමය හා සෞභාග්‍යවත් දිවයිනක් කිරීමට සැලැස්මක් හෝ ඒ සඳහා වූ කිසිම ක්‍රියාදාමයක් ඔවුන් තුළ නොවූ බව පැහැදිලිය. විදේශ ආක්‍රමණිකයන්ගේ අවශ්‍යතාව මත ශ්‍රී ලංකාව තුළ මහා මාර්ග, දුම්රිය මාර්ග, පාලම්, වාණිජ නගර බිහිවූ බව සත්‍යයකි. අපි තවමත් අද දක්වා එම ක්‍රියාදාමය තුළම ගැබ්වී වර්තමාන ආණ්ඩුව දක්වාම රට තුළ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින බව පටු දේශාභිමානයෙන් ශ්‍රී ලංකාව දෙස බලන ඕනෑම පුද්ගලයෙකුට සතුටු විය හැකිය.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ක්‍රි:ව 1505 ට පෙර විවිධ රජවරු ශ්‍රී ලාංකිය දිවයින පාලනය කළෝය. ඔවුන් අතර සුවිශේෂ වූ රාජ්‍ය පාලකවරු සිටිය හ. සත්‍යවශයෙන්ම ශ්‍රී ලංකාවේ  සමෘද්ධිය හා සෞභාග්‍යය අපේක්ෂාවෙන් මෙම දිවයින සුරම්‍ය වූ යුගයක් කරා ගෙනයාමට සැලසුම් සහගතව හා නිර්මාණුකූල තාක්ෂණයෙන් යුතුව ශ්‍රී ලංකාව තුළ යම් යම් ක්‍රියාකාරකම් එම රජවරු හා පාලකයන් විසින් කරන ලද්දේය. ඒ අතරින් අදත් ජනතාව භුක්ති විඳින වැව් අමුණු ඉදිකිරීම හා බෞද්ධ ධර්මයේ පැවැත්ම සඳහා වෙහෙර විහාර ඉදිකිරීම, ලී කැටයම් හා ගල් කැටයම් පිළිබඳව ශ්‍රී ලංකා ජනතාවට ප්‍රෞඪ ඉතිහාසයක් ඇති බව උදම් අණමින් පසක් කරයි. බෞද්ධ දර්ශනය ශ්‍රී ලාංකිකයන් සතු උතුම් වූ වස්තුවකි. බෞද්ධ දර්ශනය ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සඳහා ලොවපුරා ප්‍රචාරණය ක්‍රියාත්මක කිරීමට සමත් රාජ්‍ය පාලකයෙකු මේ දක්වා බිහිවී නොමැති බව ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් වටහාගත හැකිය. බෞද්ධ දර්ශනය එක් ජාතියක් සතු උරුමයක් නොවන අතර බෞද්ධ දර්ශනය ලොවේ පොදු උරුමයකි. බෞද්ධ දර්ශනය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ පරිපාලන ඒකකය හැටියට ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය.

මේ අයුරින් ශ්‍රී ලාංකේය දිවයින දෙස විවෘතව හා දේශාභිමානයෙන් යම් පුද්ගලයෙකු බලන්නේ නම් ක්‍රි:ව 1505 සිට 1948 දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය කළ පෘතුගීසි (වර්ෂ 153), ලන්දේසි (වර්ෂ 138) හා ඉංග්‍රීසි (වර්ෂ 136) රාජ්‍ය පාලනයක් මගින් ශ්‍රී ලංකා දිවයින සෞභාග්‍යය කරා ගෙනයාමට නිර්මාණශීලි සැලසුම් හා රටේ ජනතාව සමෘද්ධිය කරා ගෙනයාමට සැලසුම් නිර්මාණය වුයේද? අද ශ්‍රී ලංකාව තුළ පවතින රාජ්‍ය පරිපාලන ක්‍රමය,  අධිකරණ ක්‍රමය හා පාර්ලිමේන්තු නියෝජන ක්‍රමයන් බොහෝ දුරට බටහිර නෂ්ටාවශේෂ වශයෙන් පිළිබිඹුවන අතර එම පරිපාලන ක්‍රියාදාමයන් තුළ ශ්‍රී ලංකා ජනතාව එක තැන පල්වෙන ලක්ෂණ දැකිය හැකිය.

ක්‍රි:ව 1948 න් පසුව ශ්‍රී ලංකාවට අර්ධ නිදහස ලැබුණත් ක්‍රි:ව 1972 දී ශ්‍රී ලංකාව පූර්ණ නිදහස ලැබුවත් ක්‍රි:ව 1978 න් පසු ශ්‍රී ලංකාව විවෘත ආර්ථිකය කරා යොමු වුවත් අප රටේ ජනතාව මුහුණදෙන ප්‍රශ්න හා ගැටලුවලට කවදා විසඳුම් ලැබේද යන්න කාට කිවහැකි ද?

අපි ක්‍රි:ව 1948 න් පසු විවෘත දේශපාලන විමර්ශනයක යෙදෙන්නේ නම් එදා සිට අද දක්වා බිහිවූ දේශපාලන පක්ෂ විවිධ ප්‍රජා අරමුණු සඳහා එක් එක් වකවානු තුළ බිහිවිය. එදා පැවති ප්‍රධාන පක්ෂය අධිරාජ්‍යවාදීන්ට හා ධනේශ්වරවාදීන්ට දැක්වූ පක්ෂපාතීත්වය ප්‍රධාන හේතුව වීමෙන් පොදු ජනතා පක්ෂ බිහිවිය. ඒ තුළින් තම අරමුණු යම් අයුරකින් ඉටුකර ගැනීමට හැකිවුවත් එහි සාර්ථකත්වය ජනතාවට සම්පූර්ණයෙන්ම භුක්ති විඳීමට හැකිවූයේද? එදා මෙදා තුළ බිහිවූ යම් පක්ෂයක් වේද එහි ඉලක්ක ගත අරමුණු ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ජනකොට්ඨාස අතුරින් සීමිත සංඛ්‍යාවක් සඳහා විමුක්තිය ගෙන ඒමට සැලසුම් නිර්මාණය වී තිබෙන බව එම පක්ෂ තේමා පාඨ වලින් හා නායකයින්ගේ ප්‍රකාශ වලින් පැහැදිලි වුවත්, මොන පක්ෂයද ශ්‍රී ලංකාව හා එහි ජීවත්වන විවිධ ජනකොට්ඨාසයන් දෙස සමස්තයක් ලෙස බලා නිර්මාණශීලීව විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කරණය කළේ. රටත්, ජනතාවත් සෞභාග්‍යය කරා ගෙන යාමට හැකි වූයේ කුමන පක්ෂයටද?

මෙම ප්‍රශ්නය ජනතාව ඉදිරියේ ඇති විශාල ගැටලුවකි.

ඉහත ගැටලුවට සාධක වූ ප්‍රධාන ප්‍රශ්න රාශියකි. එදා මෙදා බිහිවූ සෑම පක්ෂයක්ම ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වූයේ බලය ලබාගැනීමට ය. ඒ සඳහා පක්ෂ නායකයින්ට තම මතය ක්‍රියාත්මක කිරීම සඳහා විශාල වෙහෙසක්, ශ්‍රමයත්, කාලයත් හා ධනයත් කැප කිරීමට සිදුවිය. මේ හේතුවෙන් නිදහස් චින්තනයක් ගොඩනගමින්, නිර්මාණශීලි, දීර්ඝ කාලයක් පවතින, රටේ සෑම ජන කොට්ඨාසයකටම ගැළපෙන හා ශ්‍රී ලංකාව පුරා ජීවත්වන සෑම ජනතාවටම සමාන ප්‍රතිලාභ, වරප්‍රසාද හා අයිතිවාසිකම් ලැබෙන සැලසුම් සකස් කිරීමට නොහැකි වන්නට ඇත. එම හේතුවෙන්ම විවිධ කාලපරිච්ඡේද වල ශ්‍රී ලංකාව තුළ ජාතීන් අතර, ආගම් අතර, වෘත්තීන් අතර, අරගල, ගැටුම් හා ගැටලු ඇතිවිය. මෙය වඩාත් ව්‍යාප්ත වීමෙන් රට තුළ ත්‍රස්තවාදය ඇති විය. එය අද මේ පුංචි දිවයින බෙදා වෙන් කිරීම දක්වා ප්‍රසාරණය වී ඇති බවත්, මෑත කාලයේ ශ්‍රී ලංකාව තුළ බිහිවූ ආණ්ඩු හා වර්තමාන ආණ්ඩුවද තාවකාලික හා අස්ථාවර විසඳුම් ගෙන එමින් යෝජනා ඉදිරිපත් කරමින් සිටියි.

එමෙන්ම ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ උද්ගතවී ඇති රාජ්‍ය පාලනය බෙදාගැනීම පිණිස වෙනම පරිපාලන ඒකක (ෆෙඩරල් ක්‍රමයක්) යටතේ ක්‍රියාත්මක කිරීමට යාම තුළින් පවා පවතින ප්‍රශ්නය සංකීර්ණ වී එය ශ්‍රී ලංකාව තුළ ජීවත්වන අනාගත දරු පරපුරට දායාද කරන කිසිම දවසක විසඳාගත නොහැකි ජාතික ප්‍රශ්න වැලක් නිර්මාණය වීම වැළැක්විය නොහැකි යථාර්ථයක් බවට පත්විය හැකිය.

මේ ආකාරයෙන්ම රට තුළ පවතින අනෙකුත් ප්‍රශ්න අතර පටු අරමුණු මත දේශපාලන පක්ෂ බිහිවීම, විවිධ වෘත්තීය ප්‍රශ්න, විරැකියා ප්‍රශ්න, පරිපාලන ප්‍රශ්න, අධිකරණ තීන්දු වල දෝෂ සහගත බව, ගංවතුරෙන් හා නියඟයන්ගෙන් ජනතාව පීඩා විඳීම, රටේ පාරිභෝගික ජනතාව මුහුණ දෙන

ප්‍රශ්න, රටේ වැඩිපුර ජනතාව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම, බන්ධනාගාර රැඳවියන්ගෙන් පිරියාම හා සියදිවි නසා ගැනීම, පවුල් ඒකක දෙදරා යාම වැනි ප්‍රශ්න කිහිපයක් ගෙනහැර දැක්විය හැකිය.

ඉහත ආකාරයෙන් විවිධ වූ ප්‍රශ්න හා ගැටලු ගණනාවක් ඕනෑම පුද්ගලයෙකුට පෙන්වාදිය හැකි වුවත් කිසිම රජයකට හෝ ආණ්ඩුවකට හෝ අදාළ ආයතනයකට එවැනි ප්‍රශ්න සඳහා සම්පූර්ණයෙන්ම විසඳුම් ලබාදීමට නොහැකි වී ඇත. මේ සඳහා සියලුම ප්‍රශ්න හා ගැටලු දෙස සමස්තයක් ලෙස ගෙන, එම ප්‍රශ්න හටගැනීමට හේතුවූ කරුණු සියුම් ලෙස නිරීක්ෂණය කරමින් ආසන්න හේතුව සොයා යාමේදී හෙළිවන කරුණක් හැටියට නිසි සැලසුමක් සමස්ත දේශපාලන ක්‍රියාවලියටම නොමැති බව විවිධ විද්වතුන්ගේ ප්‍රකාශන ඇසුරෙන් පැහැදිලි වන කරුණකි.

එසේ නම් සමෘද්ධිමත් සෞභාග්‍යවත් සුරම්‍ය වූ දේශයක් ගොඩනගන්නේ කවුරුන්ද ?......

අතීතය විමර්ශනය කිරීමේදී පැහැදිලි වන ප්‍රධාන කරුණක් නම් විවිධ කාල පරිච්ඡේදයන් පසුකරමින් වර්තමානය දක්වා ආ ගමනේ කිසිම දේශපාලන පක්ෂයකට, පුද්ගලයෙකුට හෝ ආයතනයකට ශ්‍රී ලංකාවට ස්ථිරසාර විසඳුම් ලබා දී, සෞභාග්‍යය කරා ශ්‍රී ලංකා දේශය නිසි දේශපාලන ප්‍රතිපත්තියක් මගින් ගෙනයාමට නොහැකි වී ඇති බව පැහැදලිය. මේ සඳහා අද අපට ශ්‍රී ලංකාව සමෘද්ධිය කරා ගෙන යාමට විශාල කැපකිරීමක් කිරීමට සිදුව ඇත.

එසේ නම් අප කුමක් කළ යුතුද?

ශ්‍රී ලංකාව තුළ ජීවත්වන හා පවතින විවිධ ජාතීන්, විවිධ ආගම්, විවිධ දේශපාලන පක්ෂ හා නායකයින් විවිධ සමාජ පංතීන්, විවිධ වෘත්තිකයන් ඒකරාශී වී වැඩ කලයුතු කාලය උදාවී ඇත. 2004 දෙසැම්බර් 26 වෙනිදා ඇතිවූ (Tsunami) මුහුදු ජලය ගොඩගැලීමෙන් ඇතිවූ විශාල විපත අපට පසක් කරන්නේ එයම නොවේද?

එමෙන්ම වර්ෂ 2009 න් අවසන් වූ LTTE සංවිධානයට එරෙහිව ක්‍රියාත්මක වූ මානුෂික මෙහෙයුමෙන් ජීවිතක්ෂයට පත්වූ හා අතුරුදන් වූ 27,000 ට අධික රණවිරුවන් හා 15,000 කට අධිකව පූර්ණ හා අර්ධ අකර්මණ්‍යතාවයට පත්වූ රණවිරුවන්ගේ පවුල් වලින් නැගෙන දුක් සුසුම් හා කඳුළැලි පසක් කරන්නේ එයම නොවේද? එමෙන්ම මානුෂික මෙහෙයුමෙන් මරණයට පත්වූ හා ආබාධයට පත් වූ රටේ ජනතාවගේ විලාපය පසක් කරන්නේ රටේ දේශපාලන ධාරාව වෙනස් විය යුතු බව නොවේද?

එම නිසා ශ්‍රී ලංකා දිවයින තුළ පවතින කුමන හෝ ආණ්ඩුවකට, වාදභේදයෙන් තොරව පවතින ප්‍රශ්න හා ගැටලු හොඳින් හඳුනාගෙන, විසඳුම්, අදහස් හා යෝජනා, නිර්මාණශීලි සැලසුම් ඉදිරිපත්කර නිවැරදිව හා රටට අවශ්‍යම දේශපාලන ප්‍රතිපත්තියක් මගින් ශ්‍රී ලංකාව සුරම්‍ය වූ දේශයක් කරා ගෙනයාමට හා රාජ්‍ය පාලනය රටේ සෞභාග්‍යය කරා යොමුකිරීමට බලපෑම් කිරීමේ දේශපාලන කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීම මූලික පදනම හා පරමාර්ථය ලෙස ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය නිර්මාණය කර බිහිකිරීම දැක්විය හැකිය.

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය
# Sri Lanka National Republican Party
# (SLNRP)

## අරමුණු හා ඉලක්ක

**අරමුණු :**

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය නිර්මාණය කිරීමේ ප්‍රධානතම අරමුණ, ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම ජාතීන්, ආගම්, වෘත්තිකයින් පක්‍ෂ භේදයකින් තොරව රටේ සංවර්ධන කටයුතු වලට හවුල්කර ගැනීමය. එමගින් ඔවුන්ගේ උගත් හා බුද්ධිමත් මත, අදහස් හා හැඟීම් සඳහා ඔවුන්ටම ආවේණික සංස්කෘතීන් අනුව ඉහළම පිළිගැනීමක් ලබා දී ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාව අතරට ඔවුන්ගේ මතයන් ගෙන යමින් රටේ ඡන්ද දායකයන් එමගින් දැනුවත් කර රාජ්‍ය පාලනය සඳහා ඉහළම සුදුසුකම් ඇති නායකයන් විධායකට හා ව්‍යවස්ථාදායකය සඳහා තෝරා පත් කර හරිමින් වඩාත් ඵලදායී රාජ්‍ය පාලනයක් සඳහා රට මෙහෙය වීමට රජයට අවශ්‍ය උපදෙස්, මග පෙන්වීම උගත් බුද්ධිමත් මණ්ඩලයක් මගින් ලබා දෙමින් හා වරින් වර රට තුළ ඇතිවන දේශපාලන, සමාජීය, ආර්ථික හා වෘත්තීමය අර්බුදයන් විසඳා ගැනීම සදහා ඊට අදාළ පාර්ශවයන් සමඟ සහයෝගයෙන් හා අවබෝධයෙන් කටයුතු කිරීම හා එවැනි අවස්ථාවක රට තුළ ඇති විය හැකි රාජ්‍ය පාලනය අස්ථාවර වීම, ආර්ථිකය කඩා වැටීම හා ජනතාව මුහුණ දෙන ආර්ථික අපහසුතාවන්ගෙන් ඔවුන්ව මුදවාගෙන ආරක්ෂා කරගැනීම සඳහා ජාත්‍යන්තර සමාජීය, ආර්ථික, දේශපාලන සංවිධාන සමඟ සම්බන්ධකම් වැඩි දියුණු කර ගනිමින් යහපත් රාජ්‍ය පාලනයක් ඇති කරලීම සඳහා පොදු ජනතාව සමඟ ඔවුන්ගේ සිතැඟියාව පරිදි කටයුතු කිරීම මෙම නව සංවිධානයේ අරමුණ වේ.

ශ්‍රී ලංකාව තුළ ජීවත්වන හා ශ්‍රී ලංකාවේ දියුණුව හා අභිවෘද්ධිය පතා නිහතමානීව උදව් කරන්ට බලාපොරොත්තු වන හා උදව් කරන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, සමිති සංවිධාන හා පුද්ගලයන්ගේ දැනුම, තාක්ෂණය හා අදහස් ශ්‍රී ලංකාවට සෞභාග්‍යය උදාකර ගැනීමට ප්‍රයෝජනවත් පරිදි ජාති, ආගම්, පක්‍ෂ, පංති භේදයකින් තොරව යොදා ගැනීමට ඒ සඳහා සුදුසු කළමනාකාරිත්වයන් හඳුනාගෙන ඒ යටතේ ශ්‍රී ලංකාවට සුදුසු නිර්මාණශීලි සැලසුම් ඉදිරිපත් කිරීමෙන් රාජ්‍ය පාලනයට උදව් කිරීම හා සහයෝගය දැක්වීමද ප්‍රධාන අරමුණු අතර වේ.

**ඉලක්කයඃ**

ශ්‍රී ලංකා දිවයින එක් ජාතියක්, එක් දේශයක්, එක් දේශපාලන දැක්මක් (ප්‍රතිපත්තියක්) තුළ සියලුම ජාතීන්ගේ හා වෘත්තීන්ගේ පිළිගැනීමක් ඇතිකර ශ්‍රී ලංකා දිවයිනේ ජීවත්වන සියලු ජනතාවගේ අභිවෘද්ධිය ඇතිවන පරිදි හා රට තුළ සමෘද්ධිය හා සෞභාග්‍යය ඇතිකර ගැනිම මගින් නව දේශයක් ගොඩනැගීම.

සමස්ත ශ්‍රී ලංකාව තුළ උතුරේ සිට දකුණටත්, බස්නාහිර සිට නැගෙනහිරටත්, ඊශාන සිට නිරිත දිශාවටත්, වයඹ සිට ගිණිකොණ දිශාවත් අතර වාසය කරන සියලුම ජනකොට්ඨාසයන්ට ජාති, ආගම්, පක්ෂ, පන්ති හා වෘත්තීය භේදයකින් තොරව රටේ ජනතාවට මනුෂ්‍යයෙක් වශයෙන් ජීවත් වීමට අවශ්‍ය පහසුකම් හා අයිතිවාසිකම් පොදුවේ එක් දේශයක් තුළ ලබා දෙමින් එක් ජාතියක් වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පාලනය විධායකයේ සිට ව්‍යවස්ථාදායකයටත්, පළාත් සභාවේ සිට දිස්ත්‍රික් සභා දක්වාත්, එමගින් මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා දක්වාත්, එමගින් ග්‍රාම සේවා කොට්ඨාස දක්වාත්, රාජ්‍ය පරිපාලනය විමධ්‍යගත කරමින් එක් දේශපාලන ප්‍රතිපත්තියක් තුළ රාජ්‍ය බලය මෙහෙයවීම මගින් සමෘද්ධිමත් දේශයක් ගොඩ නැගීම.

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## දේශපාලන ඉලක්ක හා අරමුණු සපුරා ගැනීමට යෝජනා

1. ශ්‍රී ලංකාව තුළ වර්තමාන පළාත් හා දිස්ත්‍රික්ක බෙදී ගොස් ඇති ආකාරය නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වන්නේ රාජ්‍ය පරිපාලනයේ ප්‍රතිලාභ හා අයිතිවාසිකම් රටේ සමස්ත ජනතාව අතර බෙදියාමේදී සමහර පළාත් හා දිස්ත්‍රික්කවල ජීවත් වන ජනතාවට අසාධාරණයක් සිදුවන බවයි.

මෙම තත්ත්වය අද රට බෙදා වෙන්කර උතුර හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කර වෙනම පූර්ණ බලතල ඇති පරිපාලන ඒකකයක් ඇතිකර ගැනීම දක්වා එම පළාත්වල ජීවත්වන බහුතර ජනතාව ශ්‍රී ලංකා රජයට ජාත්‍යන්තර සහභාගීත්වය ඇතිව බලපෑම් කිරීම දක්වා ව්‍යාප්ත වී ඇත.

ඉහත තත්ත්වය යටතේ වර්තමානයේ බෙදා වෙන්කර ඇති පළාත් සඳහා වෙනම පරිපාලන ඒකක ඇති කිරීම, සමස්ත ශ්‍රී ලංකාවේම රාජ්‍ය පරිපාලනය අස්ථාවර වන හා අනෙකුත් පළාත් හා එහි ජීවත්වන ජනතාවට අසාධාරණයක් සිදුවන හෙයින් ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය ශ්‍රී ලංකා රජයට පවතින පළාත් හා දිස්ත්‍රික්ක මායිම් ප්‍රතිනිර්මාණය කරමින් හඳුන්වා දෙන නව පළාත් හා දිස්ත්‍රික්ක සිතියමක් සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවගේ හා ජාත්‍යන්තරයේ අවධානය යොමු කරවීම සඳහා ඉදිරිපත්කර ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ අගනගරය ලෙස මධ්‍යම පළාතෙන් මහනුවර නැවත හඳුන්වා දිය යුතු අතර සමස්ත රාජ්‍ය පරිපාලන කටයුතු ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය වන මාතලේ සිට මධ්‍යම ආණ්ඩුව මගින් පළාත් සභා හරහා රාජ්‍ය පරිපාලන කටයුතු විමධ්‍යගත කළ යුතු වේ. අදාළ පළාත් සභා මගින් දිස්ත්‍රික් සභා දක්වා පළාත් පාලන බලය විමධ්‍යගත කළ යුතු අතර එම දිස්ත්‍රික් සභා මගින් වර්තමානයේ ක්‍රියාත්මකවන මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා විසින් රාජ්‍ය පරිපාලන කටයුතු මෙහෙයවමින් දිස්ත්‍රික් සභා සඳහා වගකිව යුතු අතර දිස්ත්‍රික් සභා පළාත් සභා වලට වගකිව යුතු අතර පළාත් සභා මධ්‍යම ආණ්ඩුවට වගකිව යුතු ක්‍රමයක් ඇති කළ යුතුය.

2. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින සෑම වෘත්තීය ක්ෂේත්‍රයකම සේවකයන් බොහෝ විට දේශපාලනීකරණය වී ඇත. එමෙන්ම වෘත්තීය අංශයන් සඳහා පත්වන ඇමතිවරු හා නියෝජ්‍ය ඇමතිවරු වැඩි පිරිසකට අදාළ ක්ෂේත්‍රයන් තුළ බොහෝ විට වෘත්තීය අවබෝධයක් නොමැතිකම හෙයින් ඔවුන්ට අදාළ පාලන කාලය තුළ එම අංශයන් අධ්‍යයනය කරමින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ඉගෙනගන්නවා හැරෙන්නට ගන්නා ලද වෘත්තීය තීරණවල දෝෂ සහගත බව පවතී. ඒ හෙයින් අදාළ අමාත්‍යාංශ බිඳවැටීමට ලක්වී මුලු රටේම ජනතාව හා ආර්ථිකය අනතුරු දායක තත්ත්වයට පත්වන හෙයින්ද එක්සත් ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය (SLNRP) රජයට යෝජනා කර සිටින්නේ රාජ්‍ය අංශයෙන් රාජ්‍ය අමාත්‍යවරයෙකු (State Minister) හා වෘත්තීය අංශයෙන්

වෘත්තීය අමාත්‍යවරයෙකු (Professional Minister) අදාළ අමාත්‍යාංශ සඳහා පත්කර රටේ ප්‍රගමනය සඳහා කටයුතු කරන්නේ නම් දිනෙන් දින පිරිහීමට පත්වන වෘත්තීය ආයතන ගොඩනගා රට පෙරට ගෙන යා හැකි බවයි. ඒ සඳහා රට තුළ පිළිගත් සෑම වෘත්තීය ක්ෂේත්‍රයක් වෙනුවෙන්ම ඔවුන් අතරින් ඉතාමත්ම සුදුසු පුද්ගලයෝ තෝරාගෙන එම ක්ෂේත්‍රයේම සිටින වෘත්තිකයන් ගේ වැඩිම මනාපයෙන් පුද්ගලයෙකු තෝරා පිළිගත් යම් කිසි කාලසීමාවක් සඳහා (උදාඃ වසර තුනක්) එම වෘත්තීය ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වෘත්තීය (Professional Minister) අමාත්‍යවරයකු වශයෙන් පාර්ලිමේන්තු නියෝජනයක් ලබාදිය යුතුයි.

3. ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය නැමැති සංවිධානය දේශයේ සියලුම ජාතින්, පිළිගත් ආගම්, සියලුම වෘත්තීය සමිති, සමාජ සේවා ආයතන, ව්‍යාපාර ආයතන ප්‍රධානින්, සමාජයේ උසස් පරිපාලන නිලධාරීන්, මහජන මන්ත්‍රීවරුන්, ආණ්ඩුවේ මැති ඇමතිවරුන්, විවිධ රාජ්‍යයන් නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ සිටින තානාපතිවරුන් ඒකරාශි කරගෙන දේශපාලන පක්ෂ භේදයකින් තොරව ශ්‍රී ලංකාවේ ආර්ථික, දේශපාලන සමාජීය පරිවර්තනයක් ඇතිකර රට සමෘද්ධිය හා සෞභාග්‍යය කරා ගෙන යාමට හා මෙම අවස්ථාවේ ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය යන නව සංවිධානයේ මතය පාර්ලිමේන්තුවට ගෙනයා යුතු බවත් ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂයෙන් නම් කරන නියෝජිතයෙකුට පාර්ලිමේන්තු නියෝජනයක් ලබා දී කැබිනට් අමාත්‍යවරයෙකු වශයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමට අදාළ අමාත්‍යාංශය භාරදීමට ගරු ජනාධිපතිතුමාට යෝජනා කර ඉල්ලා සිටීම.

4. ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය යන නව සංවිධානය ක්‍රියාකාරී ආයතනයක් සේ සලකා රජයේ අවධානය යොමු නොවන සමාජ කටයුතු සඳහා විදේශ උපදේශන, ව්‍යාපෘති ආධාර හා මානුෂීය ආධාර ලබාගැනීමට නීතිමය බලයක් ලබාගැනීමට හා වර්තමානයේ පවතින විධායකය, ව්‍යවස්ථාදායකය, හා අධිකරණ ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමෙන් අවබෝධ වන යම් යම් ක්‍රියාකාරකම් රටේ පුනර්ජීවනයට බාධාවන්නේ නම් එම ක්‍රියාකාරකම් නිවැරදි මඟට යොමුකරවීමට අවශ්‍ය සාකච්ඡාවන් කිරීම, උපදේශන ලබාදීම, විවේචනය කිරීම හා පොදු ජනතාවගේ මතය පිළිගැනීමට රජයට බලපෑම් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂයට ඇති බව විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය පිළිගත යුතුය.

5. රාජ්‍ය සේවය සඳහා 60%ක සේවකයින් හා නිලධාරීන් ත්‍රිවිධ හමුදාවේ වසර 5 ක් සේවය සම්පූර්ණ කරන ලද සෙබළුන්ගෙන් හා නිලධාරීන්ගෙන් බඳවා ගැනීම සිදුකරන ලෙස රජයෙන් ඉල්ලා සිටීම හා ඒ අනුව පෞද්ගලික අංශයටද ත්‍රිවිධ හමුදාවෙන් වසර 5 ක් සේවය සම්පූර්ණ කරන ලද සෙබළුන්ගෙන් හා නිලධාරීන්ගෙන් සේවයට බඳවා ගැනීම පිණිස යෝජනාවක් ඉදිරිපත් කිරීම. මෙයට හේතුව කාර්යක්ෂමවත්, විනීත, ජව සම්පන්න, රටට හා මනුෂ්‍යත්වයට ආදරය කරන පිරිස් රාජ්‍ය සේවයේ යෙදවීමෙන් වඩාත් හොඳ ප්‍රතිඵල රටට අත්කරගත හැකි වන බැවිනි. මේ අනුව පාසල හැරගිය සිසුන් හා විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගෙන් (උදාඃ වෛද්‍ය, ඉන්ජිනේරු, පරිපාලන හා කළමනාකරණ) වඩාත් සුදුසු පුද්ගලයන් තෝරාගැනීම මෙයින් සිදුකළ හැකි අතර රටේ සංවර්ධන කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාවෙන් විශාල මෙහෙයක් ඉටුකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

6. පූජනීය ස්ථානය, පාසල, පොලීසිය, ග්‍රාම සේවා කොට්ඨාස මගින් ගමක ප්‍රභූන් හා උගතුන් සහභාගී කරගෙන ග්‍රාමීය මට්ටමෙන් සමාජීය ප්‍රජා කටයුතු මෙහෙය වීමට රජයේ අවධානය යොමු කරවීම මගින් වඩාත් සාධාරණ අයුරෙන් රජයේ ප්‍රතිලාභ ජනතාව අතරට පත්කිරීම. (මෙය දේශපාලන පත්කිරීමක් නොවිය යුතුයි)

උදා: සහනාධාර ලබාදීම, ග්‍රාමීය මට්ටමින් දියුණු කළ යුතු අංශ සඳහා ණය ලබා දීම, ග්‍රාමීය මට්ටමෙන් ප්‍රජාව අතර ඇතිවන ආරවුල් විසඳ ගැනීම, පුනරුත්ථාපන වැඩ සටහන් මෙහෙයවීම, ආගමික නැඹුරුවක් සඳහා ප්‍රජාව යොමු කරවීම, ග්‍රාමීය ජනතාවගේ සංස්කෘතිය විනාශ කරන කටයුතු වළකා ගැනීම, ග්‍රාමීය දරුවන්, කාන්තාවන්, දුබලයින්, වයෝවෘද්ධකයින් ගේ අවශ්‍යතාවන් හා අයිතිවාසිකම් වෙනුවෙන් බලධාරීන් සමඟ එකට කටයුතු කිරීම, ප්‍රජා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා පෙරමුණ ගෙන කටයුතු කිරීමට හැකිවීම දැක්විය හැකිය.

7. ශ්‍රී ලංකාව තුළ පිළිගත් සෑම ආගමකම පූජ්‍ය පක්ෂයේ මතයන් ප්‍රකාශ කිරීම හා උන්වහන්සේලාගේ සහභාගීත්වය රාජ්‍ය පරිපාලන කටයුතු සඳහා ලබාගැනීමට පාර්ලිමේන්තු නියෝජනයක් ලබාදිය යුතුයි.

8. ශ්‍රී ලංකාව තුළ පිළිගත් සිංහල, ද්‍රවිඩ (දමිළ) මුස්ලිම් ජාතීන්ගේ අදහස් හා මත ප්‍රකාශ කිරීම සඳහා හා ඔවුන්ට උරුම සංස්කෘතිය රැක ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ ජාතිකත්ව නියෝජනයක් ලබාදිය යුතු අතර ඒ සඳහා රාජ්‍ය සහයෝගය ප්‍රමාණවත් අයුරෙන් ලබාදීමට වෙනම ආයතන ඇතිකර දිය යුතුයි.

9. බෞද්ධ දර්ශනය ආගම්, ජාති, කුල භේදයකින් තොරව ලෝකයේ සියලුම ජනතාවගේ උරුමයක් සේ සලකා එහි පරිපාලන ඒකකය ලෙස ශ්‍රී ලංකාවේ ආයතනයක් ඇතිකර උගත්, ප්‍රගතිශීලී, බුද්ධිමත් බෞද්ධ ස්වාමීන් වහන්සේලාට ප්‍රමුඛත්වය දී ලොව පුරා බෞද්ධ දර්ශනය ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා රජයේ පූර්ණ අනුග්‍රහය ලබාදිය යුතුයි.

10. කාන්තාවන් සඳහා මවක වශයෙන්, බිරිඳක වශයෙන්, තරුණියක වශයෙන්, වෘත්තීය කාන්තාවක් වශයෙන් ඔවුන්ගේ අවශ්‍යතාවන් හා අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි සමාජයේ සම තැන නොව නිසිතැන ලබා දීමට කටයුතු කළ යුතුයි.

11. කොළඹ, ත්‍රිකුණාමලය, යාපනය, මාතර, හම්බන්තොට, මඩකලපුව, පොතුවිල්, මන්නාරම, මුලතිව්, පුත්තලම, කළුතර, ගාල්ල, වාණිජ නගර ලෙස සංවර්ධනය කළ යුතුයි.

12. සෑම පළාතක්ම හා දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගෙන කාර්මික නගර, විශ්වවිද්‍යාල, කාර්මික අධ්‍යාපන ආයතන, අංගසම්පූර්ණ ආරෝග්‍යශාලා, අංගසම්පූර්ණ පාසල් (කාන්තා හා පිරිමි) රාජ්‍ය ආයතන වල අනුබද්ධ ආයතන, ප්‍රවාහන සේවය, වෙළඳපොළ හා පරිපාලන නගර ඇති කළ යුතුයි.

13. නව නගර මුල්කරගෙන නිවාස යෝජනා ක්‍රම ඇතිකර දරුවන් ඇති සෑම පවුලකටම සහන ක්‍රමයක් යටතේ නිවසක් ලබා දීමට කටයුතු කිරීම නිවාස නොමැති පුරවැසියන් වෙනුවෙන් කළ යුතුයි.

14. පළාත් පාලන ආයතන මට්ටමෙන් මගී ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා ඔවුන්ගේ පරිපාලනය යටතේ නගරාන්තර හා පළාත් පාලන ආයතන අතර මගී ප්‍රවාහනය දියුණු කළ යුතුයි.

15. ඉහත ප්‍රකාශ වූ ආකාරයෙන්ම සියලුම ජාතින්, සියලුම ආගම්, හා සියලුම වෘත්තීය අංශ නියෝජනය වන පරිදි පළාත් සභා වලට හා පාර්ලිමේන්තුවට යෝජනා කළ පරිදි නියෝජනයක් ලබාදිය යුතුයි. මක්නිසාදයත් ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවත්, ස්වෛරී භාවයත් ආරක්ෂාකර ශ්‍රී ලංකා දිවයින සමෘද්ධිය හා සෞභාග්‍යය කරා ගෙනයාමට ප්‍රධාන මෙවලම් හැටියට එම ආගමික, ජාතික, වෘත්තීය සමිති හා සංවිධාන වල දායකත්වයෙ අවශ්‍යතාව වර්තමානයේ දී ඉතාමත්ම පැහැදිලිව බුද්ධිමත් ජනතාව දකින හෙයිනි.

16. රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමානයේ විශාල ආදායමක් සෘජු බදු ගෙවන්නන්ගෙන් ලැබෙන හෙයින් ඒ සඳහා ඔවුන් වැඩි වශයෙන් උනන්දු කරලීම සඳහා ඔවුන් රජයට ගෙවන බදු ප්‍රමාණය අනුව ප්‍රශංසනාත්මක ඇගයීමක් කළ යුතු අතර එමගින් ඔවුන් රාජ්‍ය පරිපාලනය ක්‍රියාත්මක කරවීමට දායක වන හෙයින් හා රාජ්‍ය පරිපාලන යන්ත්‍රණය ඉදිරියට ගෙන යාමට තවදුරටත් දායක කර ගැනීම සඳහා යම් වරප්‍රසාදයක් ඔවුන් විසින් රජයට ගෙවන බදු ප්‍රමාණයන් අනුව (අගය කිරීමක්) ලබා දිය යුතුයි.

17. ආසන මට්ටමෙන් පෙරපාසල් දරුවන් සඳහා මුලික අධ්‍යාපන මධ්‍යස්ථාන ඇති කිරීම හා ඒ තුලින් ඔවුන්ගේ සෞඛ්‍යය, පෝෂණය හා විවිධ ළමා ගැටලු හා කුසලතාවන් හඳුනාගෙන පෞරුෂත්ව වර්ධන කටයුතු කළ යුතුයි.

18. අවුරුදු 70 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ග්‍රාමීය මට්ටමින් සෞඛ්‍යය හා පෝෂණ පහසුකම් නංවා ඒ සඳහා ක්‍රියාකාරකම් ඇතිකර ඔවුන්ගේ වයෝවෘද්ධ කාලය හොඳින් ගත කිරීමට මානසිකත්වය ගොඩ නැංවිය යුතුයි.

*** ඔබගේ අදහස් හා යෝජනා මෙම නව සංවිධානයේ අරමුණු හා ඉලක්ක සාර්ථක කරගැනීම සඳහා අප වෙත යොමු කරන මෙන් ඉල්ලා සිටිමු. එය ශ්‍රී ලංකා දේශය ප්‍රතිනිර්මාණය කිරීමට දක්වන උනන්දුව හා වගකීමද වනු ඇත.**

(මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමට මහා මණ්ඩලයේ 2/3 ඡන්දයෙන් සම්මත විය යුතුය)

## ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
## Sri Lanka National Republican Party
## (SLNRP)

# නව පළාත් හා නව දිස්ත්‍රික් ස්ථාපිත කිරීමේ යෝජනාව

ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින පළාත් හා දිස්ත්‍රික් බෙදා වෙන් කර ඇති මායිම් නැවත නිර්ණය කර පොදුවේ රටේ සියලුම ජනතාවට කාර්‍යක්ෂමව හා සර්ව සාධාරණව අයිතිවාසිකම් භුක්ති විඳීමට හැකි පරිදි රාජ්‍ය පරිපාලන ඒකක නැවත ස්ථාපිත කර රාජ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ඒ අනුව රටේ සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමට කරන යෝජනාවයි.

---

කිසියම් රාජ්‍යයක පැවැත්ම ස්ථාවරව පවත්වා ගෙන යාමට නම් එහි පරිපාලන සැකැස්ම හා ප්‍රතිපත්ති රටේ ජීවත්වන ජන සමූහය අතර සාධාරණ වන පරිදි බෙදීයන අයුරින් නිර්මාණය විය යුතු බව අප අවබෝධ කරගත් කරුණකි. නමුත් අධිරාජ්‍යවාදී පාලනයන්ට නතුවූ රටවල් අතර එම තත්ත්වය පැහැදිලිව දකිය නොහැකිය. මන්ද, බොහෝ රටවල අධිරාජ්‍යවාදී පාලනය ගෙනයනු ලැබුවේ හුදෙක්ම වෙළෙඳ අරමුණු ඉලක්ක කරගෙනය. මේ නිසා යටත් විජිත රාජ්‍යයක් තුළ පරිපාලන සැකැස්ම, පළාත් පාලන මායිම් ඇති කිරීම, රටේ නීති පද්ධතිය, නගර ඇති වීම, වරාය හා ගුවන්තොටුපළ පිහිටුවීම, මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීම හා ජනතාව අතර ආකල්ප ගොඩනැගීම අධිරාජ්‍යවාදීන්ගේ අවශ්‍යතාව හා උවමනාව පරිදි සිදු විය.

මෙම තත්ත්වය බොහෝ රටවල සමාජ අසමගිතා ඇති කිරීමට හා එම රටවල් දේශපාලනිකව හා ආර්ථිකමය වශයෙන් අස්ථාවරව තැබීමට හේතු විය. මේ හේතුවෙන් එම රටවල ජීවත්වන ජනතාව ජාති, ආගම්, කුල, පළාත්, මායිම්, වෘත්තීමය, දුප්පත්, පොහොසත්, උගත්, නූගත් වශයෙන් පක්ෂ දේශපාලනය සඳහා වෙන් වී, තම අවශ්‍යතාවන් හා අයිතිවාසිකම් වෙනුවෙන් පැවතුණු ආණ්ඩු හා රාජ්‍ය පාලකයන් සමඟ මතභේද ඇතිකර ගනිමින් සටන් වැදුණෝය. ඉහත තත්ත්වයන් අවබෝධ කරගත් රටේ උගතුන් හා බුද්ධිමතුන් නිරන්තරයෙන් පැවතුනු රජයන්ට උපදෙස් දුන්නද, එම තත්ත්වයන් වෙනස් කිරීමට රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව බලයක් පාලකයන්ට නොමැති සේ රටේ අවශ්‍යතාවන් මඟ හැර යන්නට විය. පාලකයන්ට බලය තිබුණු කල්හී ද ගන්නා ලද තීරණ තීන්දු හුදෙක්ම පාලකයන්ගේම බලය හා වරප්‍රසාද තහවුරු කර ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාව එන්න එන්නම අරාජික තත්ත්වයකට ඇද වැටුණෝය. මෙම තත්ත්වය මත ශ්‍රී ලංකාව ආර්ථික වශයෙනුත්, දේශපාලන වශයෙනුත් දුර්වල වීමෙන් විදේශ රාජ්‍යයන් හී ප්‍රතිපත්ති මත ගැලී, රට සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ණය ආධාර හා උපදෙස් ලබා ගනිමින් කටයුතු කිරීමට සිදුවිය. මේ හේතුවෙන් නිරන්තරයෙන්ම ජාත්‍යන්තර අතපෙවීම්, රට තුළ ඇතිවීම ආර්ථික හා දේශපාලන ප්‍රශ්නවලදී සිදුවිය. එම තත්ත්වය රටේ ස්ථාවරත්වයට විශාල වශයෙන් බලපෑම් ඇති කරන ලදී.

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය හොඳින් අධ්‍යයනය කිරීමේදී, රටේ සංවර්ධනයට බලපෑම් කළ හේතු රාශියක් හඳුනාගත හැකිය. එම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපෑ කරුණු කිහිපය අතරින් නිවැරදි කළයුතු සුවිශේෂී කරුණ හැටියට දකින්නේ අසමතුලිත රාජ්‍ය කළමනාකරණ රටාවය.

අප අද රාජ්‍ය පරිපාලන කටයුතු මෙහෙය වන්නේ හුදෙක්ම අධිරාජ්‍යවාදීන් විසින් අපට නිර්ණය කරදුන් රාජ්‍ය සැකැස්මක් මත සිටගෙනය. අතීත රාජ්‍ය පාලකයන් මෙන්ම වර්තමාන පාලකයන්ද සියලු සංවර්ධන කටයුතු කරනු ලබන්නේ එම සැකැස්ම මතය. ඒ තුළින් කවුරුන්වද සහතික විය හැක්කේ ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු පුරවැසියන්ට තම අයිතිවාසිකම් සාධාරණව බෙදී යන බව හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරකින බව. මේ හේතුවෙන් එම හිඩැස පිරවීමේ කුඨ අභිප්‍රායෙන්, විදේශ බලවේග ශ්‍රී ලංකාව තුළට අත පෙවීම් අද මෙන්ම අනාගතයේදීත් සිදු කරනු ඇත. මෙම තත්ත්වය මග හරවා ගනිමින්, හොඳ අවබෝධයෙන් යුතුව ශ්‍රී ලාංකිය දූ පුතුන්ට අනාගතය සුරක්ෂිත කිරීමේ වගකීම බාර ගැනීමට අද ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය අවතීර්ණ වී ඇති මොහොතක, ඊට ශක්තිය හා මාර්ගෝපදේශකත්වය සැපයීම රටේ උගත්, බුද්ධිමත් හා රටට, ජාතියට හා මනුෂ්‍යත්වයට ආදරය කරන පුරවැසින්ගේ යුතුකමකි.

ශ්‍රී ලංකාව තුළ පළාත් හා දිස්ත්‍රික් මායිම් හා රාජ්‍ය පරිපාලන ව්‍යුහය නැවත නිර්ණය කර ස්ථාපිත කිරීමෙන් රටට හා එහි ජීවත් වන පුරවැසියන්ට ඇති කරවන වාසි හා අධිරාජ්‍යවාදීන් විසින් තීරණය කර ස්ථාපිත කරන ලද පළාත්, දිස්ත්‍රික් මායිම් හා රාජ්‍ය පරිපාලන ඒකක දිගින් දිගටම පවත්වාගෙන සංවර්ධන කටයුතු කිරීමෙන්, රටට ඇති කරවන වාසි හා අවාසි මෙසේ ඔබගේ අවධානයට යොමු කරමු.

01. පළාත් හා දිස්ත්‍රික් මායිම්, රාජ්‍ය පරිපාලන ඒකක රට තුළ නැවත නිර්ණය කර ස්ථාපිත කිරීමෙන් හා එම සැලැස්ම මත රටේ සංවර්ධන කටයුතු මෙහෙයවීමෙන් රටට ඇති **වාසි.**

i. කන්ද උඩරට, කඳුකරය හා උතුරු මැද පළාත හැර අනෙක් සියලුම පළාත් වලට මහා සයුර තම ආදායම් මාර්ගයක් හැටියට පවත්වාගෙන යාමට හැකිවීම.
ii. වර්තමානයේ පවතින පළාත්වල ජන සංයුතිය (උදා- ජාති, ආගම්, කුල, වෘත්තිය, ආකල්ප, දැනුම, උගත්කම...) වෙනස් කිරීම තුළින් නව ආකල්පයන්ගෙන් හෙබි සහ නව සම්මිශ්‍රණයක් ඇති ජන සමාජයක් රටට ඵලදායී අයුරින් නිර්මාණය කිරීමට හැකිවීම.
iii. සුනාමි වැනි ස්වභාවික ආපදාවන් හී දී, පළාත් අනුව සිදුවන ආපදා අවම කර ගැනීම හා ඒ සඳහා පළාත් සභාවන්ට මුහුණ දීමේ ශක්තිය තහවුරු කිරීම.
iv. පළාත් සභා මගින් රාජ්‍ය සේවය හා බලය විමධ්‍යගත කිරීමේදී, වැඩි ජන කොට්ඨාසයකට මහ මුහුද පරිහරණය කිරීමේ අයිතිය ඇති කිරීම.
v. රටේ වැඩි පළාත් සංඛ්‍යාවක් මහ සයුරට මුහුණලා පිහිටුවා එම සෑම පළාතකටම වරායක් ඇති කිරීම තුළින් (සුළු හෝ මහා පරිමාණයෙන්) අදාළ පළාත තුළ විශාල ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට හැකිවීම.
vi. රටේ ගංගා හා මුහුදු ආශ්‍රිත ප්‍රවාහන පහසුකම් ඇති කිරීම මගින්, වර්තමානයේ රට මුහුණ දෙන ප්‍රවාහන හා ගමනා ගමන ප්‍රශ්නය අවම කර ගැනීමට හැකිවීම.
vii. නව පළාත් නිර්ණය කර, නව නගර ඉදි කිරීම මෙන්ම මුහුදු ආශ්‍රිත නව වරායන් කේන්ද්‍ර කර ගනිමින් වාණිජ නගර නිර්මාණය කර සංවර්ධනය කිරීම තුළින් කොළඹ කේන්ද්‍ර කරගෙන පැවතුනු ව්‍යාපාර අදාළ පළාත් කරා ආකර්ෂණය කර ගැනීමට හැකිවීම.

viii. කොළඹ කේන්ද්‍ර කරගෙන බස්නාහිර පළාතට සංක්‍රමණය වූ ජනතාව නව සංවර්ධිත වාණිජ නගර කරා යාම මගින් බස්නාහිර පළාතේ ඇති ජන ඝනත්වය අවම කිරීම තුළින් සිදු වී ඇති පරිසර හානියද අවම කර ගැනීමට හැකිවීම.

ix. වරාය කේන්ද්‍ර කරගෙන කොළඹ අගනගරය ලෙස ස්ථාපිත කිරීම අධිරාජ්‍යවාදීන්ගේ කැමැත්ත අනුව සිදු වුවත්, 1977 ආණ්ඩුව විසින් එය ශ්‍රී ජයවර්ධනපුර ලෙස ප්‍රකාශ කිරීමෙන්, රටේ බහුතර ජනතාවට තව දුරටත් දුරුකතර ගෙවා තම අවශ්‍යතාවයන් සඳහා කොළඹට පැමිණීමෙන් ඇති කරවන අපහසුතාව අවම කිරීම සඳහා නව රාජ්‍ය පරිපාලන සැකැස්මක් නිර්මාණය කිරීමේදි බොහෝ දුරට මාතලේ රාජ්‍ය පරිපාලන කටයුතු මධ්‍ය කේන්ද්‍රය කරගෙන ජනතාවට සේවය සපයන්නේ නම්, බහුතර ජනතාවට සාධාරණය ඉටුවේයයි විශ්වාසය ඇති කරයි. මේ අනුව නැවත මහනුවර ශ්‍රී ලංකාවේ අගනගරය ලෙස ප්‍රකාශ කිරීම රටට වාසිදායක වේ.

x. රටේ නව වාණිජ නගර නිර්මාණය කර, සංවර්ධනය කිරීමෙන්, ඒ වටා ඒකරාශී වන ව්‍යාපාරික ප්‍රජාව තුළින් ලබන බදු ආදායම වර්ධනය කරගැනීමට හැකිවීම.

xi. තෝරාගත් පරිසරයක් තුළ වඩාත් සැලසුම් සහිතව නව නිවාස සංකීර්ණ ඉදි කිරීම මගින් සෞඛ්‍ය ආරක්ෂිත ජන සමාජයක් ඇති කිරීමට හැකි වනවා මෙන්ම, වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය පුළුල් කර ගනිමින් ගොවිබිම් පැහැදිලිව හඳුනාගෙන සංවර්ධනය කිරීමට හැකිවීම මගින් පළාත් සභා කටයුතු පහසු කරවීම.

xii. පවතින නගර සංවර්ධනයට වඩා අලුත් සැලැස්මක් අනුව නව නගර, නව නිවාස සංකීර්ණ හා ජනපද ඇති කිරීම තුළින් පොදු කටයුතු හා පොදු අවශ්‍යතා වෙනුවෙන් කරන සංවර්ධන කටයුතු සඳහා වැයවන කාලය හා පිරිවැය අවම කර ගැනීමට හැකිවීම.

xiii. මේ අනුව කරනු ලබන බොහෝ සංවර්ධන කටයුතු අතර මහා මාර්ග ඉදි කිරීම, වාරි මාර්ග ඇති කිරීම, දුම්රිය මාර්ග ඉදි කිරීම මගින් රටේ බහුතර ජනතාවට පහසුකම් රාශියක් ඇති කරයි.

xiv. ශ්‍රී ලංකාවට උචිත නව සැලැස්මක් අනුව රාජ්‍ය සේවාවන් හා සංවර්ධන කටයුතු මෙහෙය වීම තුළින් රටේ බහුතර ජනතාවට පහසුව හා සාධාරණත්වය ඉටු වන අතර ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි පොදුවේ සමාජ භේදයකින් තොරව රටේ සෑම ප්‍රදේශයකම ක්‍රියාත්මක කිරීමට හැකිවීම.

02. වර්තමානයේ පවතින පළාත් හා දිස්ත්‍රික් මායිම් මත පිහිටුවා රටේ සංවර්ධන කටයුතු ඉදිරියට මෙහෙයවීම තුළින් ඇති කරවන **අවාසි.**

i. විවිධ ජන සමාජයන් අතර පවතින රාජ්‍ය පාලනය හා  බලය බෙදා හැරීම පිළිබඳ අසුභවාදී ආකල්ප අතීතයේ මෙන් වෙනස් කළ නොහැකි වීම.

ii. විවිධ පළාත් වල ජනතාව බස්නාහිර පළාතට රැකීරක්ෂා සඳහා සංක්‍රමණය වීම හා ජනතාව නාගරීකරණය වීම තුළින් ඇති කරන පරිසර දූෂණය සීමා රහිත වීම.

iii. රටේ ව්‍යවස්ථාදායකයට පත්වන බස්නාහිර පළාතින් පිට පළාත්වල වෙසෙන මහජන නියෝජිතයන් නගර කරා සංක්‍රමණය වීමෙන් පිට පළාත් වල ජීවත් වන ජනතාවගේ අවශ්‍යතාවයන් හා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට මහජන නියෝජිතයකු නොමැති වීම හේතුවෙන්, අහිංසක ජනතාව අන්ත අසරණ වී වෙනත් බලවේගයන්ගේ අතකොළු බවට පත් වීම.

iv. රටේ සීමා සහිත ජන කොටසකට පමණක් සියලු අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති අයිතිය තහවුරු කිරීම.

v. ප්‍රධාන රැකීරක්ෂා කොළඹට පමණක් කේන්ද්‍ර වී තිබීම හේතුවෙන් ගමේ උගතුන්ට රැකියා අවස්ථා අහිමි කිරීම.

vi. පිට පළාත් වල ගොවි ඉඩම් මුඩු ඉඩම් බවට ශීඝ්‍රයෙන් පත් වීම හා රටට අවශ්‍ය ආහාර නිෂ්පාදනය සඳහා පිරිස අවම වීම.

vii. රටේ කොපමණ මාර්ග ඉදිකලත්, බස්නාහිර පළාතේ පවතින මාර්ග තදබදය දිනෙන් දින උග්‍ර වීම.

viii. නාගරීකරණය වීම තුළ දිනෙන් දින දරිද්‍රතාවෙන් පෙළෙන පිරිස ඉහළයාම. (කොළඹට ජනතාව සංක්‍රමණය වීම)

ix. පොදු ජනතාවගේ යහපත සඳහා ඇති සේවා හා නීති රීති ක්‍රියාත්මක කිරීමේදී, නිලධාරීන් අපහසුතාවට පත් වීම හා පෙරළා ජනතාවද අපසුතාවට පත් වීම.

x. රටේ බොහෝ ජනතාවගේ අවශ්‍යතාවන් සඳහා දුරුකතර ගෙවා කොළඹට පැමිණීමට සිදුවීම.


xi. රටේ අභ්‍යන්තර ප්‍රශ්න සඳහා ජාත්‍යන්තර අත පෙවීම් වර්ධනය වීම.

xii. ශ්‍රී ලාංකිය ජනතාවට සැමදා විදේශ ප්‍රතිපත්ති හා විදේශ ණය මත රැඳී සිටීමට සිදුවීම.

රාජ්‍ය කළමනාකරණ ව්‍යුහයේ සැකැස්ම එනම්, ප්‍රධාන අඩිතාලම වන පළාත් හා දිස්ත්‍රික් මායිම් නැවත නිර්ණය කර, එය නිවැරදි සැලැස්මක් අනුව ස්ථාපනය කර, සංවර්ධන කටයුතු මෙහෙයවීම මගින් අනාගතයේදී රටේ පාලකයන්ට මුහුණ දීමට ඇති අභියෝග රාශියක් අවම කර ගැනීමට හැකි වනු ඇත. එමෙන්ම වර්තමානයේ කතිකාවේ යෙදෙන ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් වශයෙනුත්, රාජ්‍ය බලය පළාත් සභා හරහා සාධාරණ ලෙස විමධ්‍යගත කිරීමේ කතිකාවට අඩිතාලමක් වශයෙනුත් රාජ්‍ය සැකැස්ම ප්‍රති ව්‍යුහගත කිරීමේ මෙම යෝජනාව යම් පිටුවහලක් වන අතර රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගැනීමට හා රටේ සියලු ජනතාවට නව ආකල්ප ඇති කරමින් අළුත් රටක් බිහි කිරීමට ඇති බලාපොරොත්තුව මල්ඵල ගැන්වීමට හැකිවනු ඇත.


# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
**(SLNRP)**

## 2020 නව පළාත් සිතියම



## ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
## Sri Lanka National Republican Party
## (SLNRP)

## 2020 නව දිස්ත්‍රික් සිතියම



# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## රාජ්‍ය පරිපාලන කටයුතු සඳහා යෝජිත අමාත්‍යාංශ හා අමාත්‍යය මණ්ඩලය

| යෝජිත අමාත්‍යාංශ | රාජ්‍ය අමාත්‍යවරු | වෘත්තීය අමාත්‍යවරු | නියෝජ්‍ය අමාත්‍යවරු |
|---|---|---|---|
| 1. ආරක්ෂක, ආපදා කළමනාකරණ හා සමාජසේවා අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 2. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 3. සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 4. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 5. කෘෂිකර්ම හා වාරිමාර්ග අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 6. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 7. කම්කරු, වෘත්තීය පුහුණු, රැකීරක්ෂා හා විදේශ සේවා අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 8. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 9. වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 10. ඛණිජ තෙල් හා ඛණිජ සම්පත් අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 11. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 12. ළමා, කාන්තා, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය | ✓ | ✓ S ✓ T ✓ M | |
| 13. මුදල්, ක්‍රම සම්පාදන හා ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 14. ප්‍රවෘත්ති, කලා හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 15. ක්‍රීඩා හා සංචාරක අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 16. විදේශ, නිපුණතා සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය | ✓ | ✓ | ✓ |
| 17. බුද්ධ සාසන හා පුරාවිද්‍යා අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 18. අධිකරණ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 19. ඉඩම්, නිවාස හා යටිතල පහසුකම් අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 20. විදුලිබල හා බලශක්ති පුනර්ජනනීය අමාත්‍යාංශය | ✓ | | ✓ |
| 21. නගර සංවර්ධන, පාරසරික, වනසත්ව හා වනරක්ෂණ අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 22. ආයෝජන ප්‍රවර්ධන, ග්‍රාමීය ආර්ථීක හා ආර්ථීක කටයුතු අමාත්‍යාංශය | ✓ | ✓ | |
| 23. තාක්ෂණ, විදුලි සංදේශ හා ඉදිකිරීම් අමාත්‍යාංශය | ✓ | ✓ | |
| රාජ්‍ය අමාත්‍යවරු | 23 | | |
| වෘත්තීය අමාත්‍යවරු | | 17 | |
| නියෝජ්‍ය අමාත්‍යවරු | | | 9 |
| **එකතුව** | | | **49** |

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## ක්‍රියාකාරිත්වය

1 **සාමාජිකත්වය ලබාදීම :**

SLNRP සංවිධානයට නිත්‍යානුකූල පිළිගැනීමක් හා ලියාපදිංචිය ලබාගැනීමෙන් අනතුරුව සාමාජිකත්වය වර්ධනය කිරීමට පහත ප්‍රකාශිත පුද්ගලයන්, ආයතන හා සංවිධානවලට නව සංවිධානයේ අරමුණු, ඉලක්ක, ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍යයෙන් දැනුවත්කර ඔවුන්ගේ අදහස් අනුව විද්‍යුත් මාර්ගයෙන් රටේ සියලු ජනතාව දැනුවත් කර සාමාජිකත්වය ලබාගැනීමට කැමති සංවිධාන, ආයතන, හා පුද්ගලයන් ලියාපදිංචි කර ඔවුන් සඳහා කෙටිකාලයක් ඇතුළත මහා සභා රැස්වීමක් කැඳවා වැඩිදුරටත් නව සංවිධානයේ අරමුණු හා ඉලක්ක හා එහි වර්තමාන අවශ්‍යතාව පිළිබඳව දැනුවත් කර ඒ සඳහා ලගාවිය යුතු ක්‍රියාමාර්ග පිළිබඳවද දැනුවත් කිරීමකින් අනතුරුව සංවිධානයේ නව නිලධාරීන් පත්කරගත යුතුය.

2 **නිලධාරින් පත්කිරීම :**

- සභාපති හා උපසභාපති පත්කිරීම
- මහලේකම් හා උපලේකම් පත්කිරීම
- භාණ්ඩාගාරික හා උපභාණ්ඩාගාරික පත්කිරීම
- උපදේශන මණ්ඩලයක් පත්කිරීම, මෙහි සාමාජිකත්වය සඳහා නම්කරනු ලබන්නේ,
  - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
  - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අගමැති
  - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කථානායක
  - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විපක්ෂ නායක
  - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රවිනිශ්චකාරතුමා
  - විදේශ රාජ්‍යයන් නියෝජනය කරන ශ්‍රී ලංකාවේ සිටින තානාපතිවරු
  - ශ්‍රී ලංකාව තුළ පිළිගත් සියලු ආගම් නායකවරු
  - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිපති
- රටේ සෑම වෘත්තියකම, ජාතියකම, ආගමකම නියෝජනය වන පරිදි කමිටු සාමාජිකයන් පත්කිරීම සහ ලේකම්වරු පත්කිරීම.

3 **රැස්වීම් පැවැත්වීම:**

1. ඉතාමත් කෙටි කාලයකින්ම නව නිලධාරි මණ්ඩලය පත්කර ගැනීම සඳහා ආරම්භක මහා සභා රැස්වීමක් කැඳවා, ඒ දක්වා සාමාජිකත්වය ලබාගත් සියලුම විශේෂ හා සාමාන්‍ය සාමාජිකයන් කැඳවීම කරනු ඇත.

2. සියලු නිලධාරින් කැඳවා මාසික කමිටු රැස්වීම් පැවැත්වීම. (අදාළ ක්ෂේත්‍රයන් මත) සතිපතා අනුකමිටු රැස්විය යුතුය.

3. ත්‍රෛමාසිකව සාමාජිකත්වය කැඳවා සහා රැස්වීම් පැවැත්වීම. (මේ සඳහා උපදේශන මණ්ඩලයේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම කළ හැකිය.)
4. අර්ධ වාර්ෂික රැස්වීම සඳහා සාමාජිකත්වය කැඳවා සාමාජිකත්වය විසින් හා උපදේශන මණ්ඩලයෙන් ඉදිරිපත් කෙරෙන අදහස් හා යෝජනා සහා සම්මත කරගැනීම සහභාගි වූ සාමාජිකත්වයෙන් 2/3 මනාපයෙන් කළ යුතුය.
5. වාර්ෂික මහා සම්මේලනය සඳහා සියලුම නිලධාරීන්, සාමාජිකයන් හා උපදේශන මණ්ඩලය කැඳවා සංවිධානයේ පසුගිය කටයුතු හා එහි ප්‍රතිඵල හා අනාගත සැලසුම් හා ක්‍රියාකාරකම් මහා සභාවට ඉදිරිපත්කර විශේෂ වූ යෝජනා, සහභාගීත්වයෙන් 2/3 ක ඡන්ද බලයෙන් සහා සම්මත කරගෙන ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමේ වගකීම අදාළ නිලධාරීන්ට පැවරිය යුතුය.
6. හදිසි සහා රැස්වීම්, රට තුළ පවතින ඕනෑම සමාජීය හා දේශපාලනමය අස්ථාවරතාවන් හිදී, හදිසි අවස්ථාවක් සේ සලකා කැඳවීමේ බලය සංවිධානයේ නිලධාරීන්ගෙන් 1/2 මනාපයෙන් කටයුතු කළ හැකි අතර හදිසි තීරණ හා යෝජනා, සහභාගීත්වයෙන් 2/3ක මනාපයෙන් සම්මත කරගැනීමෙන් ක්‍රියාත්මක වීමේ බලය ඇත. ඒ පිළිබඳව මහා සභා සම්මේලනයට වගකිම හදිසි අවස්ථා රැස්වීමට සහභාගි වූ සියලුම සාමාජිකයන්ගේ වගකීමකි.

**4 සාමාජික මුදල් :**

සාමාජික මුදල කොපමණ විය යුතු ද යන්න ආරම්භක සභා රැස්වීමේදි තීරණය කර එය යෝජනාවෙන් සභා සම්මත කළ යුතුයි. එම සාමාජික මුදල වාර්ෂිකව හෝ මාසිකව ගෙවීමේ අවස්ථාව සාමාජිකත්වයට ඇත. සභාවේ කැමැත්ත පරිදි ඕනෑම රාජ්‍ය බැංකුවක සාමාජික මුදල් තැන්පත් කිරීමට බලය ඇති අතර සාමාජික මුදල් පාලනය භාණ්ඩාගාරික සතුවේ. අවශ්‍යතාවන් මත මුදල් නිදහස් කිරීමේදි සභාවේ කැමැත්ත පරිදි නිලධාරීන් තුන්දෙනෙකු පත්කළ හැකිය.

උදා : (ලේකම්, භාණ්ඩාගාරික, කමිටු සාමාජිකයෝ)

**5 සංවිධානය නමින් අරමුදලක් පිහිටුවීම :**

මෙම අරමුදල පිහිටුවීමේ අරමුණ රට තුළ උද්ගත වන හදිසි ආපදා අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීමට හා රට තුළ ඇතිවිය හැකි හදිසි දේශපාලන හා සමාජීය අස්ථාවරතාවන් හී දී ක්‍රියාත්මක වීමට හා අවශ්‍යතාවක් ඇතිවන ඕනෑම අවස්ථාවක හා මහා සභා සම්මේලනයෙන් යෝජනා කරන කටයුතුවලට යෙදවීමට අරමුණු කරයි.

මේ සඳහා වෙනම අරමුදල් භාරකාර මණ්ඩලයක් පත් කළ යුතු අතර එහි පරිපාලනය හා වගකීම ඔවුන් සතුවේ. එම මණ්ඩලය සඳහා සංවිධානයේ සෑම අතින්ම සම්බන්ධ වූ ක්ෂේත්‍රයන් හී එක් පුද්ගලයකු වශයෙන් නියෝජනය විය යුතුය.

ඔවුන් අතර අදාළ කටයුත්ත සඳහා වගකිව යුතු නිලධාරීන් පත්කළ හැකි අතර ඒ සඳහා රාජ්‍ය බැංකුවක ගිණුමක් විවෘත කළ යුතුය. මුදල් නිදහස් කිරීමේදි මහ සභාවේ සභාපති, මහ ලේකම් හා භාණ්ඩාගාරිකගේ ලිඛිත අවසරය ලබාගත යුතුය.

## 6 නිලධාරින්ගේ සේවා කාලය

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂයට තේරී පත්වන නිලධාරින්ගේ නිල කාලය අවුරුදු දෙකක් වන අතර සෑම අවුරුදු දෙකක් අවසානයේදී අර්ධවාර්ෂික සැසිවාරයක් තුළ නව නිලධාරි මඩුල්ලක් තෝරා පත් කළ යුතුය. නැවත නිලධාරි මඩුල්ලක් පත්කිරීමේදී පෙර වතාවන්වල තේරී පත්වූ නිලධාරින්ගේ දක්ෂතාව, කැපවීම, නිපුණතාව අනුව සාමාජිකත්වයට ඔවුන් නැවත නැවත යෝජනා කිරීමෙන් නව නිලධාරි මඩුල්ල සඳහා පත්කිරීම් කළ හැකිවේ. මෙම සංවිධානයේ උපදේශන මණ්ඩලය මෙම සංවිධානයේ යාවජීව සාමාජිකයන් සේ පිළිගනු ලබන අතර ඔවුන් එම නිලතලවලින් ඉවත්වීමේදී නව පත්වීම් ලබන පුද්ගලයන්ට නැවත සාමාජිකත්වය නිරන්තරයෙන් හිමිවන අතර එම තනතුරුවලින් ඉවත් වූ පුද්ගලයන් සඳහා පුද්ගලිකව මෙම සංවිධානයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකි වේ.

## 7 ක්‍රියාකාරී මණ්ඩල පත් කිරීම

- ශ්‍රී ලංකා සමාජීය ආර්ථික හා දේශපාලන පර්යේෂණ හා ප්‍රතිපත්ති සැළසුම් මණ්ඩලය.
- ශ්‍රී ලංකා නීති අධ්‍යයන හා වර්තමාන නීති සඵලතා නිරීක්‍ෂණ හා නව නීති හඳුන්වාදීමේ මණ්ඩලය.
- ශ්‍රී ලාංකිය ජාතීන්, ආගම් හා විවිධ වෘත්තිකයින් රටේ පොදු සංවර්ධනය සඳහා ඵලදායී ලෙස යොදවා ගැනීමේ අධ්‍යයන මණ්ඩලය.
- රාජ්‍ය ආයතන ආදායම් හා වියදම් නිරීක්‍ෂණ හා ප්‍රතිලාභ පොදු ජනතාව අතරේ සාධාරණව බෙදීයාම අධ්‍යයන හා දැනුවත් කිරීමේ මණ්ඩලය.
- ශ්‍රී ලංකා පාසල්, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, අධ්‍යයන ආයතන මගින් පිටවන අනාගත ශ්‍රම බලකාය රටේ සංවර්ධනය සදහා නිසි පරිදි යොදවා ගැනීමේ ප්‍රතිපත්ති හඳුන්වා දීමේ හා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් මණ්ඩලය.
- රටේ සියලුම ශ්‍රම හා ස්වාභාවික සම්පත් හොඳින් හඳුනාගෙන රටේ සංවර්ධනයට නිසි අයුරින් යොමු කිරීමේ උපදේශන මණ්ඩලය .
- කාන්තා, ළමා හා දුබලයින් ආරක්‍ෂා කිරීමේ හා ප්‍රජා ලිංගික අධ්‍යාපන අධ්‍යයන හා සුභසාධන මණ්ඩලය.
- ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර සම්බන්ධතා සහයෝගිතා මණ්ඩලය.
- හදිසි ආපදා හා සැකසුරුවම් අධ්‍යයන හා දැනුවත් කිරීමේ ක්‍රියාකාරී මණ්ඩලය.
- (SLNRP) ආරක්‍ෂක මණ්ඩලය.
- (SLNRP) මුදල් භාරකාර මණ්ඩලය.
- කාලීන ගැටලු හා ප්‍රශ්න නිරීක්‍ෂණ හා විසඳුම්, සාකච්ඡා, සංවාද හා (SLNRP) ප්‍රකාශන, ජනමාධ්‍ය, රූපවාහිනී හා පුවත්පත් මණ්ඩලය.
- (SLNRP) මහජන සම්බන්ධතා, දුක්ගැනවිලි හා සහන මණ්ඩලය.
- ශ්‍රී ලංකාව හා ලෝක ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලන අධ්‍යයන, නිරීක්‍ෂණ, ගවේෂණ හා පර්යේෂණ මණ්ඩලය.

සියලුම ක්‍රියාකාරී මණ්ඩල (SLNRP) සභාපතිතුමාගේ උපදේශකත්වය, නායකත්වය, මගපෙන්වීම හා පාලනය යටතේ පවතින අනු ආයතන වේ. එසේ නමුත් එම මණ්ඩල ප්‍රධානියාගේ හා අදාළ විද්වතුන් කණ්ඩායමේ දැනුම, අත්දැකීම් හා මහජනතාවගේ අවශ්‍යතාවන් හා ශ්‍රී ලංකාවේ අනාගත සුභසිද්ධිය සඳහා ස්ථාවර අඩිතාලමක් දැමීමේ අරමුණින් හුදෙක් තීරණ ගැනීමේ හා ඔවුන්ගේ (මහ මණ්ඩලය) අභිමතය පරිදි කටයුතු කිරීමේ හැකියාව ඇති අතර (SLNRP) සංවිධානයේ අරමුණු ඉක්මවා යාමක් ඇතිවුවහොත් එය පාලනය කිරීමේ බලය මහ මණ්ඩලයට හා (SLNRP) සභාපති තුමාට ඇත.

ක්‍රියාකාරී මණ්ඩල වල නිලධාරීන්, (SLNRP) විශේෂ සාමාජිකයන්ගෙන්, ඔවුන්ගේ කැමැත්ත පරිදි ක්‍රියාකාරී මණ්ඩල සඳහා පත්වීමට අදාළ විෂය දැනුම, හැකියාව, උනන්දුව හා අත්දැකීම තිබිය යුතුයි.

## 8 විසුරුවා හැරීම

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂයේ මහා සංවිධානයේ අරමුණු හා ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වුවහොත් මුළු සාමාජිකත්වයේ 3/4 ක මනාපයෙන් මෙම සංවිධානය විසුරුවා හැරිය හැකි අතර ඒ අවස්ථාව වන විට සංවිධානය සතු සාමාජික මුදල් හා අරමුදල් ජනාධිපති අරමුදලට හෝ සංවිධානය විසින් අනුමත කරන ඕනෑම අරමුදලකට බැර කළ යුතු අතර මෙම සංවිධානය මගින් එතෙක් දුරට පවත්වාගෙන එනු ලැබුවා වූ විවිධ සාමාජික ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතීන් අදාළ රාජ්‍ය ආයතන වලට අනුබද්ධ කළ යුතුය. අදාළ ව්‍යාපෘතීන් මගින් ඒ වන විටත් ප්‍රතිලාභ ලබන්නාවූ ජනතාවට අවහිරයක් නොවිය යුතුයි.

## * (සැලකිය යුතුයි)

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය යන නව සංවිධානය ආරම්භ කිරීමට පාදක වූ ඉහත සඳහන් ප්‍රධාන අරමුණු හා ඉලක්ක කරා නිර්මාණශීලීව හා සැලසුම් සහගතව රාජ්‍ය පාලනයට යොමු කිරීමට අදාළ යෝජිත ප්‍රකාශනය, මෙම සංවිධානයේ සාමාජිකත්වය ලබන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සමිති සංවිධාන, ආයතන, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති හා පුද්ගලයන්ගේ මූලික එකඟතාවට, සාමූහිකව හා වෙන් වෙන් වශයෙන් තම කැමැත්ත ඇති බව මෙම නව සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් තවදුරටත් තහවුරු කර ප්‍රකාශ කරන බව වගකීමෙන් යුතුව සෑම සාමාජිකයෙකුම පිළිගත යුතුය. අනාගතයේදී මේ ආකාරයෙන් ඉදිරිපත්වන යෝජනා රාජ්‍ය පාලනයට ඉදිරිපත් කිරීමට සම්පූර්ණ විශේෂ සාමාජිකත්වයෙන් 2/3 මනාපයක් තිබිය යුතු වේ.

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
# (SLNRP)

## සාමාජිකත්වය

1. ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සියලුම ජාතීන් නියෝජනය වන පරිදි ඔවුන්ගේ වැඩි කැමැත්ත පරිදි නියෝජනය කරනු ලබන ජාතික නියෝජිතයන්.
   - සිංහල
   - ද්‍රවිඩ (දමිළ)
     - (අ) ශ්‍රී ලංකා දමිළ
     - (ආ) ඉන්දියානු සම්භවයක් ඇති දමිළ
   - මුස්ලිම්
   - බර්ගර්
   - මැලේ
   - අනෙකුත් ජාතීන්

2. ශ්‍රී ලංකාව තුළ පිළිගත් ආගම් නියෝජනය කරන පරිදි පූජක පක්ෂයේ නියෝජනය.
   - බෞද්ධාගම
   - ක්‍රිස්තියානි ආගම
   - හින්දු ආගම
   - ඉස්ලාම් ආගම
   - අනෙකුත් පිළිගත් ආගම්

3. ශ්‍රී ලංකාව තුළ පිළිගත් සියලු වෘත්තිකයන් නියෝජනය වන පරිදි එම සමිති සමාගම් ආයතන නියෝජිතයෝ (රාජ්‍ය හා /රාජ්‍ය නොවන).

4. අධිකරණ ක්ෂේත්‍රය නියෝජනය කරන නිලධාරීහු, නීතීඥවරු හා වෘත්තීය සමිති නියෝජිතයෝ.

5. වෛද්‍ය ක්ෂේත්‍රය (පෙරදිග හා අපරදිග) නියෝජනය කරන නිලධාරීන්ගේ වෘත්තිය සමිති නියෝජිතයන් හා වෛද්‍යවරු.

6. ඉංජිනේරු ක්ෂේත්‍රය නියෝජනය කරන විවිධ ඉංජිනේරු අංශ නියෝජිතවරු හා වෘත්තීය සමිති නියෝජිතවරු.

7. මහාචාර්යවරු, ආචාර්යවරු හා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු සහ පාසල් ගුරුවරු හා විදුහල්පතිවරු නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයෝ.

8. පරිපාලන වෘත්තීය ක්ෂේත්‍රය තුළ නියෝජනය වන සමාජයේ ප්‍රධාන නිලධාරින් (රාජ්‍ය හා රාජ්‍ය නොවන).

උදා :

a. දිසාපතිවරු
b. දිස්ත්‍රික් ලේකම්වරු
c. ග්‍රාමසේවකවරු
d. සංවර්ධන නිලධාරින්
e. ආයතන පරිපාලන නිලධාරින්
f. රාජ්‍ය හා පෞද්ගලික ආයතන අධ්‍යක්ෂවරු
g. අමාත්‍යාංශ ලේකම්වරු
h. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදේශ රටවල සිටින තානාපතිවරුන් හා කොමසාරිස්වරු

9. සියලුම විශ්වවිද්‍යාල හා පාසල් නියෝජනය කරන ශිෂ්‍ය සංගම් නියෝජිතයෝ.

10. සියලුම කම්කරු වෘත්තින් නියෝජනය වන වෘත්තිය සමිති නියෝජිතයෝ.

11. සියලුම ගොවි සමිති සමාගම් නියෝජනය වන වෘත්තිය සමිති නියෝජිතයෝ.

12. සියලුම ලිපිකරුවන් නියෝජනය වන වෘත්තිය සමිති නියෝජිතයෝ.

13. සියලුම වරලත් විගණකාධිකාරිවරු හා ගණකාධිකාරිවරු හා එම ආයතන නියෝජනය කරන නියෝජිතයෝ හා එම වෘත්තිය සමිති නියෝජිතයෝ.

14. සමාජසේවා ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයෝ.

15. ධීවර ජනතාව නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයෝ.

16. ප්‍රවාහන ක්ෂේත්‍රය නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයෝ.

17. රේගු නිලධාරින් නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයෝ.

18. සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරික සමිති නියෝජනය කරන නියෝජිතයෝ.

19. බැංකු හා මූල්‍ය ආයතන නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයෝ.

20. රක්ෂණ ආයතන නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයෝ.

21. සියලුම කලා අංශ නියෝජනය කරන සමිති නියෝජිතයෝ.

22. සියලුම ක්‍රීඩා අංශ නියෝජනය කරන සමිති නියෝජිතයෝ.

23. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය නියෝජනය කරන සියලුම වෘත්තිය සමිති නියෝජිතයෝ.

24. ඉහතින් සඳහන් නොකළ නමුත් ශ්‍රී ලංකාව තුළ සියලුම වෘත්තිය සමිති නියෝජනය කරන නියෝජිතයෝ.

25. ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය හී අරමුණු, ඉලක්ක හා ප්‍රතිපත්ති පිළිගන්නා බුද්ධිමත් පුරවැසියෝ.

26. ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි **සියලුම පක්ෂවලින් නියෝජනය** කරන **පක්ෂ** නියෝජිතයෝ.

27. ලක් ජනතාව නියෝජනය කරන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු.

28. විදේශ රාජ්‍ය නියෝජනය කරන ශ්‍රී ලංකාවේ සියලුම තානාපතිවරු හා කොමසාරිස්වරු.

29. ත්‍රිවිධ හමුදාපතිවරු.

30. කැබිනට් අමාත්‍යවරු (වර්තමාන රජයේ).

31. ශ්‍රී ලංකාවේ සියලුම අමාත්‍යාංශවල අමාත්‍යවරු හා නියෝජ්‍ය අමාත්‍යවරු.

32. ඉහත සඳහන් නොවූ යම්කිසි පිළිගත් ප්‍රජා සත්කාරයේ යෙදෙන සමිති සමාගම් හෝ ආයතන වේ නම් එම ආයතන නියෝජිතවරු.

33. මධ්‍ය හා මහා පරිමාණයේ ව්‍යාපාර හිමියෝ .

34. ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය හා සමෘද්ධිය පතන ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු වලට ආධාර කිරීමට කැමති ඕනෑම විදේශ රාජ්‍යයන් හා ආයතන නියෝජිතවරු.

35. දේශීය හා විදේශීය දානපතීන්

- යම් සංවිධානයක් නියෝජනය කරමින් ලබාගන්නා සාමාජිකත්වය විශේෂ සාමාජිකත්වය සේ සලකන අතර වාර්ෂික සාමාජිකත්ව මුදල රු1000/-කි. ඡන්ද බලය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත. (සාමාජික මුදල සභාරැස්වීම් මගින් වරින් වර වෙනස් කරනු ලැබිය හැකිය) මේ සඳහා තනි පුද්ගලයන් වශයෙන්ද අයදුම් කළ හැකිය.

- තනි පුද්ගලයන් සේ ලබාගන්නා සාමාජිකත්වය සාමාන්‍ය සාමාජිකත්වය වන අතර වාර්ෂික සාමාජික මුදල අදාළ නොවේ. සාමාන්‍ය සාමාජිකත්වය සඳහා සභාවේ ඡන්ද බලය /මනාපය හිමි නොවන අතර සාමාන්‍ය සාමාජිකත්වය මගින් සංවිධාන ශක්තිය පිළිබිඹු කරයි.

- SLNRP හී ආරම්භක සාමාජිකත්වය මෙම සංවිධානය තුළ ක්‍රියාකාරී විශේෂ සාමාජිකත්වය සේ සලකන අතර ඡන්ද බලය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත.

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
# (SLNRP)

## සාමාජික අයදුම්පත්‍රය

ලියාපදිංචි අංකය: [ ] ලියාපදිංචි දිනය: [ ]

සම්පූර්ණ නම : ……………………………………………………………………………
……………………………………………………………………………

ලිපිනය : ……………………………………………………………………………
……………………………………………………………………………

දුරකථන අංකය :……………………………ෆැක්ස් අංකය: ……………………………

ඊ-මේල් : ……………………………වෙබ් ලිපිනය : ……………………………

වෘත්තිය/ තත්වය :……………………………………………………………………………

රැකියා ස්ථානය :……………………………………………………………………………
……………………………………………………………………………

නියෝජනය කරන (වෘත්තිය සමිතිය/ආයතනය/සංගමය/පක්ෂය/සමිතිය/ සංවිධානය ) නම:

……………………………………………………………………………

(නියෝජිතයෙකු වශයෙන් සාමාජිකත්වය ලබාගන්නේ නම් අදාළ සංවිධානයේ ලියා පදිංචි සහතිකය හෝ පත්වීම් ලිපියේ පිටපතක් හෝ SLNRP සාමාජිකත්වය ඉල්ලා අදාළ සංවිධානයේ ලිපි ශීර්ෂය යටතේ ඉදිරිපත් කරන ලිපිය අමුණන්න. මෙය පෞද්ගලික අයදුම් සඳහා අදාළ නොවේ.)

නියෝජන ආයතනයේ ලිපිනය:……………………………………………………………
……………………………………………………………

දුරකථන අංකය :…………………………… ෆැක්ස් අංකය: ……………………………

ඊ-මේල් :…………………………… වෙබ් ලිපිනය :……………………………

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය/සංවිධානයේ ප්‍රකාශිත ප්‍රතිපත්ති, පරමාර්ථ, අරමුණු, ඉලක්ක හා යෝජනා සපුරාගැනීම සඳහා මම/අපි (පුද්ගලිකව/සංවිධානය /වෘත්තීය සමිතිය/දේශපාලන පක්ෂය/ ආයතන/සංගමය) මගින් සියලුම සාමාජිකයන් තනි තනිව හා වෙන් වෙන් වශයෙන් / පූර්ණ සහයෝගය ලබා දෙමින් (SLNRP) සංවිධාන තුළ ක්‍රියාකාරීව (විශේෂ/සාමාන්‍ය සාමාජිකත්වය) යටතේ කටයුතු කිරීමට කැමති බව (නියෝජිතයාගේ නම හෝ නම් )

……………………………………………………………………………

වෙනුවෙන් මම/අපි (සංවිධානය/වෘත්තිය සමිතිය/ආයතනය/පක්ෂය/සංගමය/සමිතිය) මෙයින් ප්‍රකාශ කර සිටිමි/සිටිමු.

දිනය : ………………… ……………………

අත්සන හෝ අත්සන්

විශේෂ සාමාජිකත්ව අයදුම [ ]

සාමාන්‍ය සාමාජිකත්ව අයදුම [ ]

(√ හෝ X අයදුම සඳහා සලකුණු කරන්න)

# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)



### SLNRP නිර්මාතෘ

ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂයේ නිර්මාතෘ ශ්‍රේ ගුණසිංහ මහතා 1960 ඔක්තෝම්බර් මස කොළඹදී පවුලේ වැඩිමහල් පුතු ලෙස උපත ලැබීය. ඔහු දේශීය පාසල් කීපයකම නේවාසිකව අධ්‍යාපනය ලබා ඇති අතර එම පාසල් බෞද්ධ, කතෝලික හා මිශ්‍ර  පාසල් විය. වාණිජ අංශයෙන් උසස් පෙළ ශාස්ත්‍ර හදාරමින් සිටි අවධියේදීම ඔහු අවබෝධ කරගත්තා, කොතරම් දුරට අධ්‍යාපනය ලැබුවත් රජයේ රැකියාවක් සොයා යාමේදි එදා මෙන් හෙටත් දේශපාලකයන් පසුපස තරුණ තරුණියන්ට හෝ ඔවුන්ගේ දෙමාපියන්ට යාමට සිදුවන බව. ඒ හෙයින් කිසිම දිනයක රජයේ රැකියාවක් නොකරන තීරණයෙන් පාසලෙන් ඔහු සමුගත්තේය. කුඩා අවධියේ සිට ඉංජිනේරු වෘත්තියට වැඩි කැමැත්තක් දක්වූ හෙයින් ඉංජිනේරුවරයෙකු වීමේ අධිෂ්ටානයෙන් යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් කොළඹ විවෘත විශ්වවිද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරිය. ඒ අතරතුර කාර්මික අංශයෙන් ප්‍රායෝගික දැනුම ලබා ගැනීමට පෞද්ගලික ආයතනයක පුහුණුව ලබමින් රැකියාවේ වසර පහක කාලයක් නියුක්ත විය.

වර්ෂ 1988 අවදියේදී හදිසියේම විදේශ ගතවීමට ඔහුට සිදු වූ අතර එම කාලය තුළ ලෝකයේ රටවල් 10 කට අධික සංඛ්‍යාවක සංචාරය කර ඇත. එම වකවානුව තුළ ජාත්‍යන්තර ව්‍යාපාරිකයන් හා දේශපාලකයන් හමු වී ඇති අතර ඔවුන් සමඟ ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු, ආනයන හා අපනයන කටයුතුවල යෙදීම මගින් ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු හා වෙළඳ ගනුදෙනු පිළිබඳව විශාල අත්දැකීම් රාශියක් ඔහු ලැබූ අතර, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළඳපල වෙත ගෙනයාමටත්, දියුණු කාර්මික රටවල නිෂ්පාදිත යන්ත්‍රසූත්‍ර හා භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලංකාවට ගෙන ඒමටත් මැදිහත් කරුවෙකු වශයෙන් කටයුතු කර ඇත. ව්‍යාපාරික කටයුතු ජාත්‍යන්තරය සමඟ පහසුවෙන් කරගෙන යාම සඳහා වර්ෂ 1989 දී වර්ල්ඩ්ෂයින් ලංකා පෞද්ගලික සමාගම ආරම්භ කර එහි කළමනාකාර අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර සංවර්ධනය හා ආයෝජන ප්‍රවර්ධන උපදේශකවරයෙකු

වශයෙන් කටයුතුකර ඇත. මෙම කාලය තුළ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශ්‍රම අධ්‍යාපනවේදී (BLE) උපාධිය හා මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ (MFE) පශ්චාත් උපාධිය ලබාගෙන ඇත. වර්තමානයේ ව්‍යාපාර සංවර්ධන, මූල්‍ය හා ආයෝජන ප්‍රවර්ධන, ආර්ථික විශේෂඥවරයෙකු ලෙස තම ව්‍යාපාරය තුළ කටයුතු කරමින් නව දේශපාලන, ආර්ථික, ව්‍යාපාරික, හා සමාජ සංවර්ධන සංකල්පනා රැසක් රටේ උන්නතිය සඳහා පැවතුණු රජයන්ට හඳුන්වා දී ඇත.

ඒ අතර නිවසක් හදාගෙන දරු පවුලත් සමඟ සතුටින් ජීවත් වීමේ අපේක්ෂාවෙන් මැද පෙරදිග යන කාන්තාවන් සඳහා "**රන්වියන හෝම්ස්**" නම් වූ නිවාස සංකල්පය, තරඟකාරී වෙළෙඳපළ තුළ සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ට ඇති අභියෝග අවම කරමින් තම ව්‍යාපාර කටයුතුවලින් ලාභය උපරිමකර ගනිමින් ව්‍යාපාර ඉදිරියට ගෙන යාමට "**ටැලන්ට් බැංකු**" සංකල්පය, ශ්‍රී ලංකාව කේන්ද්‍ර කරගෙන ලෝක ව්‍යාපාරික හා සංචාරකයින් සඳහා වූ "**බ්ලූචිප්**"නම් වූ ව්‍යාපාරික හා සංචාරක මධ්‍යස්ථානයක සංකල්පය, අධ්‍යාපනයෙන් ලොව ජය ගැනීම සඳහා පවුලේ සැමට එකම ස්ථානයකදී ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා වූ "**ෆැමිලි ඉංග්ලිෂ් කොලෙජ්**" නම් වූ සංකල්ප ප්‍රධාන තැනැක් ගනියි. ඒමෙන්ම සාමාජීය ගැටලුවලදී අසරණ දුප්පත් ජනතාව වෙනුවෙන් මැදිහත්ව අදාළ රාජ්‍ය නිලධාරීන් හා දේශපාලකයින් සමගින් සාකච්ඡා කරමින් විසඳුම් ලබාගැනිමට කටයුතු කරදීම මෙන්ම, ඔවුන්ට රටේ පවතින නීතිය අනුව උපදෙස් ලබා දෙමින් බොහෝ විසඳුම් නිවැරදිව ලබා ගැනීම සඳහා යොමු කිරීමද සිදුකර ඇත.

## ශ්‍රේ ගුණසිංහ මහතාගේ දේශපාලන ආගමනය.

ශ්‍රේ ගුණසිංහ මහතා මුලින්ම රටේ දේශපාලන ගමන් මග වෙනස් විය යුතු බව තීරණය කරන්නේ වර්ෂ 2004 දෙසැම්බර් 26 දී සුනාමිය ශ්‍රී ලංකාවට බලපෑ අවස්ථාවේ රට අස්ථාවර වී විදේශ ආධාර හා උපකාර අපේක්ෂාවෙන් සිටින මොහොතේ දී ය. එමෙන්ම අවුරුදු 30 ක් පැවැති LTTE සංවිධානයේ ක්‍රියාකාරිත්වය හේතු කොට ගෙන රටේ අහිංසක ජනතාවට විඳින්ට සිදු වූ සියලුම වධ වේදනා හා එය මර්දනය කිරීමට ශ්‍රී ලංකා රජයට මුහුණ දීමට සිදුවූ මානුෂීය මෙහෙයුම හේතුවෙන් ඇති වූ ජාත්‍යන්තර අතපෙවීම් මෙන්ම 1971 කැරැල්ල හා 1983, 1989 කාලපරිච්ඡේද වලදී ජනතා විමුක්ති පෙරමුණ විසින් ක්‍රියාත්ම කළ භීෂණය හේතුකොට ගෙන රටේ ජනතාව මුහුණ දුන් ගැටලු හා එවැනි භීෂණයන් නැවත ඇති නොවීමට රටේ ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කළයුතු හෙයින් මෙන්ම, දිනෙන් දින කඩා වැටෙන රටේ ආර්ථිකය හා සියලුම අංශවල විනය පිරිහීම පිළිබඳ ඉතා සියුම්ව යෙදුණු තාර්කික නිරීක්ෂණයකින් හා විමර්ශනයකින් අනතුරුව, ඊට සාපේක්ෂව දියුණු වූ රටවල් වල දේශපාලනික, ආර්ථික හා සමාජ සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා ගන්නා ලද අත්දැකීම් සමුදායක් පිළිබඳව අවබෝධයෙන් යුතුව, රටේ උගත් බුද්ධිමත් ජනතාවගේ ප්‍රකාශන මෙන්ම රටේ වර්තමාන, ආර්ථික, දේශපාලන හා සමාජීය ගැටලුකාරී තත්ත්වය හා මෙන්ම, ජාත්‍යන්තරය සමඟ ඇති කරගෙන ඇති වෙළෙඳ හා විදේශ ප්‍රතිපත්ති පිළිබඳව ඉතා උවමනාවෙන් රටට, ජාතියට හා බෞද්ධ දර්ශනයට ළෙන්ගතු පුරවැසියෙකු ලෙස කල්පනා කිරීමේදී මෙම අවස්ථාව ඉතාමත්ම කාලෝචිතයයි හැඟී ගිය හෙයින් දේශපාලනයට පිවිසීමට අදහස් කරන ලදී.

ශ්‍රේ ගුණසිංහයනගේ දේශපාලන ප්‍රතිපත්තිය නම්;

'' මාගේ ජාතිය මනුෂ්‍ය ජාතිය යි
මාගේ ධර්මය මනුෂ්‍ය ධර්මය යි
මාගේ පක්‍ෂය මනුෂ්‍ය පක්‍ෂය යි
මාගේ දර්ශනය මනුෂ්‍ය දර්ශනය යි
දේශපාලනයේදී මා ජාති, ආගම්, කුලමල උස් මිටිකම් නොතක යි
මාගේ දේශපාලනය මනුෂ්‍යත්වය සඳහාම යි''

වර්ෂ 2005 ජනවාරි මාසයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය කළ සියලුම ජනාධිපතිවරු සහ අගමැතිවරු අමතා ශ්‍රී ලංකා දේශපාලන ගමන් මග බිම් මට්ටමේ සිට එනම් ශ්‍රී ලංකාව බෙදා වෙන්කර ඇති පළාත් හා දිස්ත්‍රික්ක සීමා මායිම් සිට වෙනස් විය යුතු යැයි වරින් වර ලිපි යොමු කරන ලදී. නමුත් ඒ සඳහා මැනවින් ඔවුන්ගේ අවධානය යොමු නොවුණි.

ශ්‍රේ ගුණසිංහයන් මුලින්ම දේශපාලනයට පිවිසීමේ අදහස ඊට අදාළව ලියන ලද වර්තමානයේ ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්‍ෂය නමින් එළි දක්වන මෙම දේශපාලන අරමුණ හා ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරන ලද්දේ එවකදී පැවති දේශපාලනය පිළිබඳව වැඩියෙන් අදහස් දැක්වූ දේශප්‍රේමීන් අතරින් මාදුළුවාවේ සෝභිත හිමි, හාරිස්පත්තුවේ ආරියවංශාලංකාර හිමි, සූරියප්පෙරුම මහතා හා කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වන ධම්ම දිසානායක මහතාට වන අතර ඔවුන්ගේ අදහස් හා යෝජනා අනුව ශ්‍රේ ගුණසිංහ මහතාට දේශපාලනය සඳහා පිවිසීමට නිශ්චිත කාලය එළඹෙන තුරු සිටීමට සිදු විය.

ශ්‍රේ ගුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන අනාගතයේදී නිවැරදි විය යුතු දේශපාලන යෝජනා, සැලසුම්, ප්‍රතිපත්ති, හා නව දේශපාලන දර්ශනයක ක්‍රියාකාරකම්වල සංක්‍ෂිප්ත ප්‍රකාශනය.

1. පළාත් හා දිස්ත්‍රික් මායිම් වර්තමාන දේශපාලන බලය විමධ්‍යගත කිරීමට ඉතා සුදුසු අයුරින් සියලු පුරවැසියන්ට රාජ්‍ය සේවයේ ප්‍රතිලාභ ඒකාකාරීව ලැබෙන පරිදි ප්‍රතිනිර්මාණය කර සියලු සංවර්ධන කටයුතු ඒ මත සිට රට තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා කිරීම.
2. ඉහත ප්‍රකාශනය සාක්ෂාත් කරගැනීමට රාජ්‍ය ව්‍යවස්ථාව හා ප්‍රතිපත්ති සකස් කිරීමට යෝජනා කිරීම.
3. ඉහත පළමු හා දෙවන ප්‍රකාශනයන්ට අනුව විදේශ ප්‍රතිපත්ති හා රාජ්‍ය යන්ත්‍රණය සකස් කිරීමේ සීමාවන් තීරණය කිරීමට යෝජනා කිරීම.
4. වර්තමානයේ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ අධ්‍යාපනය සඳහා දළදේශීය නිෂ්පාදිතයෙන් 6% ක සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරමින් ශ්‍රී ලංකිය ජනතාවගේ සාක්ෂරතාව 94% කට වැඩි අගයක් ගන්නා අවස්ථාවක සියලු පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නා වූ මන්ත්‍රීවරුන්ගේ අවම අධ්‍යාපන මට්ටම ලෙස උපාධියක් තිබීම අනිවාර්ය කිරීම.

5. නව පළාත් හා දිස්ත්‍රික් නිර්ණය කිරීම අනුව වැඩිම ප්‍රතිශතයක් භාවිත කරන භාෂාව අනුව අදාළ රාජ්‍ය පරිපාලන කටයුතුවලදී ප්‍රමුඛත්වයක් ලබාදීමට යෝජනා කිරීම.
6. ශ්‍රී ලංකාවේ අගනුවර මහනුවර ලෙස පිළිගැනීම හා රාජ්‍ය පරිපාලන කේන්ද්‍රය මහනුවර හා දඹුල්ල අතර තෝරාගත් ස්ථානයක (මාතලේ) ස්ථාපිත කිරීමට යෝජනා කිරීම.
7. නව පළාත් හා දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගෙන සියලු පහසුකම් ඇතිව නව නගර නිර්මාණය කිරීම තුළින් රට පුරා විසිරී පැතිරී සිටින දුක් විඳින ජනතාව සඳහා සියලු පහසුකම් සහිත නිවාස, පාසල්, වෙළෙඳ පොළ, හා ප්‍රවාහන පහසුකම් සපයා දීම තුළින් ඔවුන් මුහුණ දෙන සියළු ගැටලුවලින් ඔවුන් නිදහස් කිරීම.

   උදා :- අලි මිනිස් ගැටුම, ජලය හා විදුලිබලය නැති ප්‍රදේශවල ප්‍රශ්න, ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති ප්‍රශ්නය, දරුවන් දුරුකතර ගෙවා යන පාසල් ප්‍රශ්නය, ගංවතුර හා ස්වාභාවික විපත් ඇතිවීමේ ප්‍රශ්නය, සෞඛ්‍ය හා ප්‍රවාහන ප්‍රශ්න ඒ අතරින් සමහරකි.
8. අනුරාධපුර කේන්ද්‍ර කරගෙන ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම. **ලොව පුරා බෞද්ධ දර්ශනය වර්තමාන අවශ්‍යතාවක් සේ සලකන හා පිළිගන්නා රටවල් සමඟ විශේෂ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, සමාජීය, වෙළෙඳ යන අංශයන්ගෙන් ගොඩනගා ගනිමින් මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත පරිදි නව පළාත් පාලන ආයතන සඳහා නව ශ්‍රී ලංකිය ව්‍යවස්ථාවක් යටතේ සංවර්ධන කටයුතු කිරීමට බලය ලබාදීමට යෝජනා කිරීම.** මෙහිදී තෝරා ගන්නා රටවල් සමඟ ද්විපාර්ශවීය එකඟතාව මත දෙරටේම ජනතාව (on arrival visa) නිදහස් ගොඩබැසීමේ වීසා පදනම මත සංචාරය කිරීමට අවස්ථාව ලබා ගැනීමට අපේක්ෂා කරයි.
9. **මේ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන හා දේශපාලන කටයුතුවලදී (අතපෙවීමට හෝ බලපෑම් කිරීමට) මැදිහත් වීමට අවසර ලැබෙන්නේ හා එය පිළිගනු ලබන්නේ ඉහත 8 වැනි ප්‍රකාශනයට අනුව රාජ්‍ය ප්‍රතිපත්තියක් හැටියට කටයුතු කරන රාජ්‍යන්ට හා ජාත්‍යන්තර සංවිධානවලට පමණි.** මෙම ප්‍රකාශනය නව රාජ්‍ය ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීමට යෝජනා කරන (clause) වගන්තියකි.
10. අනුරාධපුර කේන්ද්‍ර කරගෙන නිර්ණය කරන තෝරාගත් භූමි ප්‍රමාණයක් තුළ ඉහත 8 වැනි ප්‍රකාශනයට අනුව කටයුතු කිරීමට බුද්ධ ශාසනයට ලබා දෙන අතර එම භූමිය තුළ ජීවත්වන ජනතාව බෞද්ධ දර්ශනයට අනුව පාලනය කිරීමේ බලය, භූමියේ සියලු ක්‍රියාකාරකම් බුද්ධ ශාසනයේ අභිප්‍රාය අනුව මෙහෙයවීමට හා රටතුළ අලුතින් නිර්ණය කරන පළාත් සභාවක් තුළ පාර්ලිමේන්තුව නියෝජනය ව්‍යවස්ථානුකූලව බලය පැවරීමට යෝජනා කිරීම..
11. ඉහත 8 හා 10 ප්‍රකාශනයන් සඳහා සියලු ප්‍රතිපාදන මධ්‍යම රජයෙන් ව්‍යස්ථානුකූලව ලබා දීමට කටයුතු කිරීම හා ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීමට මහජන ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය වුවහොත් කටයුතු කිරීම.
12. ගොඩබිම ප්‍රවාහන කටයුතු මගින් ඇතිවන පරිසර දූෂණය හා ප්‍රවාහන තදබදය අවම කිරීම සඳහා මුහුදු හා ගංගා ආශ්‍රිත භාණ්ඩ හා මගී ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනය ලබා දීමට කටයුතු කිරීම.

13. ශ්‍රී ලංකිය ව්‍යාපාරිකයන්ට බදු සහන හා අඩු පොලී අනුපාතයකට සහන ණය ලබා දෙමින් දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීමට කටයුතු කිරීම හා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන භාණ්ඩ වර්ග ආනයනය සීමා කිරීම.

14. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් හදුනාගෙන වාණිජ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට ආයෝජකයන් පොළඹවා ගැනීම හා ඒ සඳහා කටයුතු කිරීමට උනන්දු කරවීම.

15. එදිනෙදා කුලී කර්මාන්තයෙන් ජීවත්වන කම්කරුවන් සඳහා ස්ථිර ආදායම් මාර්ගයක් දිස්ත්‍රික් ලේකම්වරුන් කේන්ද්‍ර කරගෙන ඇති කිරීම. මෙමගින් ඔවුන්ගේ දරුපවුල් ආරක්ෂා කරගෙන පෝෂණය කිරීමේ හැකියාව සියලුම කුලී කරුවන්ට හිමිවනු ඇත.

16. ගෘහ සේවකයන් සඳහා ස්ථිර ආදායම් මාර්ගයක් හා ආරක්ෂාව විශේෂ පනතක් මගින් තහවුරු කිරීම.

17. වයස අවුරුදු 16 හා 17 යෞවනයන්ගේ ආරක්ෂාව හා රැකියාවක නියුක්තවීමට ඇති බාධාවන් ඉවත් කිරීම හා අයිතිවාසිකම් වෙනුවෙන් නව පනතක් හඳුන්වා දීම.

18. පාරිභෝගික ජනතාව ආරක්ෂා කිරීම සඳහා පවතින පනත් සංශෝධනය කිරීම හා එය බල ගැන්වීම.

19. මන්නාරම් දිස්ත්‍රික්කය තුළ නව කාර්මික නගරයක් පිහිටුවීමෙන් දැනට ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවා ඇති කර්මාන්ත එම කාර්මික නගරය තුළට ගෙන යාමට දිරි ගැන්වීම.

20. සෑම වෘත්තීය ක්ෂේත්‍රයකම සේවය කරන සේවකයන්ගේ ආරම්භක මූලික වැටුප වර්තමාන ජීවන වියදම අනුව රු. 40,000 ක් ලෙස තීරණය කිරීම හා උපයන විට ගෙවීමේ ආදායම් බදු සීමාව රු. 100,000 දක්වා නිදහස් කිරීම හා යම් රැකියාවක වෘත්තියක් පුහුණු වන අයකුගේ අවම මූලික දීමනාව රු. 25,000 ක් ගේවීමට යෝජනා කිරීම.

21. විශ්වවිද්‍යාල හා කාර්මික විද්‍යාල ශිෂ්‍ය දීමනාව මසකට රුපියල් 15,000/- දක්වා තලයක පිහිටුවීමට යෝජනා කිරීම.

22. සෑම වෘත්තිකයකුගේම (රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ) මාසික වැටුපට 10% ක වැටුප් වැඩි කිරීමත්, රුපියල් ලක්ෂයකට අඩු මාසික වැටුපක් ලබන සේවකයන්ගේ මාසික වැටුපට එකතු කර ගෙවීමට යෝජනා කිරීම.

23. රජයේ නිවාඩු සීමා කිරීම. සෑම වර්ෂයකම ඉරිදා හා පෝය දින නිවාඩු මෙන්ම ප්‍රධාන ජාතික දින හා ආගමික දින වන සිංහල හා හින්දු අලුත් අවුරුදු නිවාඩුව, වෙසක් නිවාඩුව හා නත්තල් නිවාඩුව රටේ අනිවාර්ය නිවාඩු දින සේ සලකන අතර මැයි 01 වෙනිදා වැඩ කරන ජනතාවගේ නිවාඩු දිනය මෙන්ම රටේ වීරවරයන්ගේ දිනය ලෙස ප්‍රකාශ කරන අතර ශ්‍රී ලංකාවේ නිදහස් දින නිවාඩුව අවලංගු කිරීමට යෝජනා කිරීම.

එමෙන්ම 74% ක් වන ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ ජනතාව සඳහා අනෙකුත් ජාතීන්ගේ හා ආගම් නිවාඩු දින අදාළ නොවන අතර එම ආගමික හා ජාතික නිවාඩු ඔවුන්ට පමණක් අදාළවන නිවාඩු දින වන අතර ඔවුන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් නිවාඩු ලබා දිය යුතු අතර එම නිවාඩු වාර්ෂික නිවාඩු දින 42 ට බාහිර නිවාඩු දිනයන් බව සැලකිය යුතුය. සියලුම බැංකු නිවාඩු දිනයන් අවලංගුකර එම දිනයන් පාරිභෝගික අවශ්‍යතාවන් සඳහා මූලිකත්වය දී විවෘතව තැබිය යුතු වේ.

24. පරිසර දූෂණය, වායු දූෂණය, ශබ්ද දූෂණය හා ජල දූෂණය අවම කිරීමට ඇති පනත් බලගැන්වීම, නව සංශෝධන හා පනත් ගෙන ඒමට කටයුතු කිරීම මගින් මනුෂ්‍යයාගේ සෞඛ්‍ය තත්ත්වය හොඳින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

25. රටේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට සියලු ගොවි සංගම් බලගන්වමින් ඔවුන්ට නව තාක්ෂණ දැනුම හා යන්ත්‍රසූත්‍ර භාවිතය පිළිබඳ මෙන්ම කාබනික පොහොර භාවිතය පිළිබඳව දැනුවත් කර ඒ සඳහා මූල්‍ය ආධාර ලබාදීම මෙන්ම ශ්‍රී ලංකිය රජය මැදිහත්වී ගොවි නිෂ්පාදන වෙළඳපළට ගෙනයාමට ක්‍රමවේදයක් සකස් කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථිකය දියුණු කිරීම.

26. රටේ ධීවර කර්මාන්තය දියුණු කිරීමට ධීවර සංගම් බලගන්වමින් නව තාක්ෂණය භාවිතය මගින් හා ඒ සඳහා අවශ්‍ය ණය ආධාර සපයමින් රටේ මාළු අස්වැන්න වැඩි කිරීමට හා ටින් මාළු ඇසුරුම් කර්මාන්තය දියුණු කිරීමට රජයේ අවධානය යොමු කිරීම.

27. රටේ අනෙකුත් සුළු හා මධ්‍යම කර්මාන්ත කරුවන්ට ණය ආධාර ලබාදෙමින් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා නිශ්චිත වෙළඳපළක් ලබාදීමට කටයුතු කිරීමෙන් එම කර්මාන්ත කරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම හා ඊට අදාළ පනත් හෝ චක්‍රලේඛන වේනම් ඒවා සංශෝධනය කරමින් ඔවුන්ට කර්මාන්තය කරගෙන යාමට ඇති බාධාවන් ඉවත් කිරීම.

28. මධ්‍යම රැකියා බැංකුවක් ඇති කර සියලුම රැකියා ඉල්ලුම් කරුවන්ගේ අධ්‍යාපන මට්ටම හා අත්දැකීම් සැලකිල්ලට ගෙන අදාළ පළාත් සභා හෝ දිස්ත්‍රික් සභා හෝ මධ්‍යම ආණ්ඩුවේ පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම හා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා සඳහාද එම ඉල්ලුම්කරුවන් යොමු කිරීමට කටයුතු කිරීම.

29. පාසල් අධ්‍යාපන කාලය තුළ යම් සිසුවකු අට වන ශ්‍රේණිය සමත්වීමෙන් අනතුරුව ඔහුගේ හෝ ඇයගේ දෙමව්පියන්ගේ කැමැත්ත මත යම් කර්මාන්තයක් පුහුණු වීමේ අවස්ථාව ලබාදීම.

30. සියලුම ජාතීන් හා සියලුම ආගම් අදහන සිසුන්ට එකම පාසලක් තුළ අධ්‍යාපනය ලබාදීමට පළාත් මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් කටයුතු කිරීම තුළින් ජාතීන් අතර සම්බන්ධකම් ඇති කිරීමට කටයුතු කිරීම හා ඒ සඳහා රජයෙන් පූර්ණ ප්‍රතිපාදන ලබාදීම මගින් අනෙකුත් පාසල් ඒ සඳහා උනන්දු කරවීම.

31. සෑම පළාතක්ම මුල්කරගෙන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ඇති කිරීම මගින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඇතුල්වන සිසුන් සංඛ්‍යාව පුළුල් කිරීමට කටයුතු කිරීම. මෙමගින් විදේශ භාෂා දැනුම ඇති කිරීම තුළින් ජාත්‍යන්තර රැකියා අවස්ථා ලබා ගැනීමට හා ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීම.

32. ශ්‍රී ලංකාවේ නව නිපැයුම් කරුවන් සඳහා පුළුල් ආයතනයක් ඇතිකර තම නිපුණතාව වර්ධනයකර රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ඇති අවස්ථාව නිර්මාණය කිරීම.

33. ලෝකයේ ඛනිජ තෙල් මිල ඉහළ පහළ යාමේදි රට තුළ ඛනිජ තෙල් මිල ස්ථාවරව තබාගැනීමට ලෝකයේ පවතින උපාය මාර්ගික මූල්‍ය ක්‍රමවේදයන් භාවිතා කිරීම.

34. කාන්තාවන් මැදපෙරදිග ගෘහ සේවයට යාම අධෛර්ය කිරීමට හා බොහෝ තරුණයන් ත්‍රීවිල් රැකියාවට අවතීර්ණ වීම අධෛර්ය කිරීම සඳහා නව උපායමාර්ගික රැකියා වෙළඳපළක් රට තුළ ඇති කිරීමට කටයුතු කිරීම.

35. ජාතිය හා ආගම මුල්කරගෙන රටේ ක්‍රියාත්මක වන සියලුම දේශපාලන පක්ෂ අහෝසි කිරීම.

36. පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මහජන නියෝජිතයන්ගේ පාර්ලිමේන්තු කටයුතු සඳහා පැමිණීම 80% ක් නොවන්නේ නම් ඔවුන්ට ගෙවන විශ්‍රාම වැටුප් හා දීමනා අහෝසි කිරීම.

37. සියලුම පාරිභෝගික භාණ්ඩ හා සේවාවන් අනිවාර්ය ප්‍රමිතිගත කිරීමකට ලක්කරන අතර එම භාණ්ඩ හා සේවා පාරිභෝගිකයන්ට අලෙවි කිරීමේදී ගෙවන මුදලට කුවිතාන්සියක් නිකුත් කිරීම අනිවාර්ය කරවන අතර එය සමාජයේ ඉහළ සිට පහළ මට්ටම දක්වා අලෙවිකරණයේ යෙදෙන සියලුම පුරවැසියන්ට අදාළ වේ. මේ අනුව පවතින සියලුම පනත් සංශෝධනය කර බලගැන්වීම.

38. ඍජු බදු හා වක්‍ර බදු පිළිවෙලින් 80% හා 20% මට්ටමට ගෙන ඒමට අදාළව උපාය මාර්ගික බදු ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් පාරිභෝගික භාණ්ඩ මිල ජනතාවට දැරිය හැකි මට්ටමකින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

39. ප්‍රධාන වෘත්තීය විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කරන සියලුම වෘත්තිකයන් සඳහා පාර්ලිමේන්තු නියෝජනයක් හා වෘත්තීය අමාත්‍යවරුන් ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබාදීමෙන් අපේක්ෂා කරනුයේ අදාළ ක්ෂේත්‍රයන් ශක්තිමත් කිරීමේ හා දියුණු කිරීමේ වගකීම ඔවුන්ට පැවරීම හෙයින් අනාගතයේදී අදාළ වෘත්තීය ක්ෂේත්‍රයේ වගකීම ඔවුන් දැරිය යුතු අතර ඒ සඳහා රජයට දෝෂාරෝපණය කිරීම අවසන් කිරීම.

උදා - සෞඛ්‍ය, අධ්‍යාපන, කෘෂිකර්මය, ධීවර, කම්කරු , පාරිභෝගික, කර්මාන්ත, සංචාරක, ජනමාධ්‍යය, ක්‍රීඩා, කලා, බුද්ධ සාසන, ඉංජිනේරු හා තාක්ෂණ

40. පාසල් අධ්‍යාපනයට ඉතිහාසය, භූගෝලය, බෞද්ධ දර්ශනය, සාහිත්‍යය සහ තෝරාගත් විෂයන් නැවත එක් කිරීම.

41. මුහුදු ඉවුරු, ගංගා ඉවුරු, ඇළ දොළ වැව් අමුණු ඉවුරු සංරක්ෂණය කිරීම හා ඊට අදාළ නීති හා පනත් සංශෝධනය හා බල ගැන්වීම.

42. ඉහත ප්‍රකාශිත සියලු කරුණු අධීක්ෂණය කරමින් අදාළ අංශයන් සඳහා තම වාර්තාවක් ඉදිරිපත් කර සමාජය නිවැරදි කිරීම සඳහා සමාජ අධීක්ෂණ කණ්ඩායමක් ලෙස තෝරාගත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල උපාධිය ලබාගත් සිසුන් හා ඒ සඳහා කැමැත්තක් දක්වන උගත් තරුණ තරුණියන් යම් කාල සීමාවක් සඳහා ජනාධිපති බලතල සහ පාර්ලිමේන්තු බලතල අවශ්‍ය පරිද ආරුඪකර සියලු නව තාක්ෂණික පහසුකම් ලබා දී සමාජගත කිරීමෙන් සමාජගත ගැටලු ක්ෂණිකව හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාත්මක වීමට නව පනතක් මගින් මධ්‍යම ආණ්ඩුවේ බලය ජනතාව අතරට විමධ්‍යගත කිරීම.

43. දිවයින පුරා A/L සමත් සිසුන් සමාන ලකුණු මට්ටමකට අනුව විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවස්ථාව ලබා දීම. මෙයට ප්‍රධාන හේතුව එසේ විවිධ ලකුණු මට්ටම්වලින් විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රවේශය ලැබූ සිසුන්ගෙන් අපේක්ෂිත අරමුණු මේ දක්වා ඉටු නොවීමය.

44. වැඩකරන ජනතාවට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට තිබෙන අයිතිය හා අවස්ථාව පුළුල් කිරීමට රජයේ අවධානය යොමු කිරීම. මේ අනුව පාසල් අධ්‍යාපනයෙන් පසුව රජයේ

විශ්වවිද්‍යාලයකට ඇතුළු වී අධ්‍යාපනය ලැබීමට නොහැකි වූ තරුණ තරුණියන්ට එම අවස්ථාව ලබාදීමෙන් වැඩකරන ජනතාවගේ අපේක්ෂාවන් අවදිකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

45. ජාතික හෝ ආගමික වශයෙන් කැපීපෙනිමට පළඳනා හා වස්ත්‍ර පොදු ස්ථානවල හා ප්‍රසිද්ධ ස්ථානවල පැළඳීම තහනම් කිරීම. එම වස්ත්‍ර හෝ පළඳනා ආගමික හා ජාතික උත්සව දිනයන් හි පමණක් පැළඳීමට සීමා පැනවීම. මෙම තහනම ආගමික පූජක වරුන්ට අදාළ නොවේ. මෙම නීතිය ජාතික සම්බන්ධතා ආරක්ෂා කිරීමට හා සාමය පවත්වාගෙන යාමට කරන ලද යෝජනාවකි.

46. ශ්‍රී ලංකාවේ විවිධ දේශපාලන පක්ෂ විසින් දේශාපාලන වෘත්තීය සමිති පිහිටුවා ගනිමින් වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරනවා යන මුවාවෙන් වැඩ කරන ජනතාව මෙන්ම වෘත්තියේ ගෞරවයද කෙළසා දැමීම අවසන් කිරීම හා වෘත්තිකයන්ටම වෘත්තීය ගෞරවය රැක ගනිමින් එම ක්ෂේත්‍රයන් හි දියුණුව හා සංවර්ධනයේ වගකීම දැරීමට හැකිවන පරිදි පාර්ලිමේන්තු නියෝජනයක් ලබා දීම.

47. ඉන්දීය සම්භාවයක් ඇති වතුකරයේ ද්‍රවිඩ ජනතාව අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය පරිදි ශ්‍රී ලංකාවේ සේවයේ යෙදවීමෙන් රට තුළ ඇති වී තිබෙන දේශපාලන අස්ථාවර භාවය හා රටට ගැළපෙන ප්‍රතිපත්ති ගෙන ඒමේදී, එම නිසා පවතින බාධාවන් ඉවත් කිරීමට හා ශ්‍රී ලංකා දේශපාලන ධාරාව රටට හා පොදු ශ්‍රී ලාංකීය සංස්කෘතියට ගැලපෙන පරිදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට ඇති සියලුම  බාධාවන් ඉවත් කිරීම හා එමගින් ඔවුන්ට යුක්තිය ඉටු කරදීම .

48. වසර පහෙන් පහට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයන් අභිප්‍රේරණය කිරීමෙන් හා ඇගයීමෙන් වඩාත් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ජනතාවට ලබා දීම මෙන්ම වැඩි පිරිසකට රාජ්‍ය සේවයට ඇතුළත් වී ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව උදා කිරීම.

49. ශ්‍රී ලංකාව තුළ නීතිය හා සාමය  කඩකරන පුද්ගලයන්ට එරෙහිව විනිශ්චයකාරවරු අධිකරණයේදී ලබාදෙන නඩු තීන්දු තීරණාත්මක වන අවස්ථාවන් හි දී, ඊට ප්‍රතිවිරුද්ධ වාදීන්ගේ ක්‍රියාවන්ගෙන් ඔවුන් ආරක්ෂා කරගැනීම පිණිස හා රජයේ බදු ආදායම හෝ වෙනත් බදු එකතු කිරීම් හෝ ඒ සම්බන්ධයෙන් තීරණ ගන්නා රජයේ ප්‍රධාන නිලධාරීන් වන රේගුව, ආදායම් බදු, සුරා බදු හා වෙනත් එවැනි ආයතන නිලධාරීන් හා රටේ ආහාර හා සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි මහතුන්ට දැනට පවතින ආරක්ෂාවට වැඩි ආරක්ෂාවක් ඔවුන්ගේ කාර්යය රජයට පක්ෂපාතීව උපරිමයෙන් කරගෙන යාමට ලබාදිය යුතු අතර පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකුට ඇති බලය හා වරප්‍රසාදවලට සමාන මට්ටමකින් වරප්‍රසාද ලබාදීමට යෝජනා කිරීම.

ශ්‍රේ ගුණසිංහ මහතාගේ සීයාගේ සහෝදරයකු වන අධිරාජ්‍යවාදී කම්කරු පාලනයට එරෙහිව වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ලබාගැනීම වෙනුවෙන් සටන් කළ කම්කරු නායක ඒ. ඊ. ගුණසිංහ මහතා විසින් රටේ ජනතාවට දායාදකර දුන් ප්‍රතිලාභ හා වරප්‍රසාද රාශියකි. එම වරප්‍රසාද හා ප්‍රතිලාභ අදටත් ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාව බුක්ති විඳිති. එවන් ජන නායකයකුගේ පවුලෙන් පැවත එන ශ්‍රේ ගුණසිංහ මහතා ඉතා පරිණත යුගයට ගැලපෙන රටේ ජනතාව අපේක්ෂා කරන නව දේශපාලන නායකයෙකි. ඔහු විසින් ප්‍රකාශ කරන සියලු දේශපාලන ප්‍රතිපත්ති  හා සැලසුම් රටේ වර්තමාන දේශපාලන අස්ථාවර භාවය හා ජනතාවගේ අවශ්‍යතාවන්ට කදිම විසඳුමකි.

මන්දයත් ඔහුගේ ආර්ථික, සමාජීය, දේශපාලන, විසඳුම් පවතින අර්බුදයන්ට පැලස්තර නොවන හෙයිනි.

ඉතා ගැඹුරින් ශ්‍රේ ගුණසිංහ මහතාගේ දේශපාලන දර්ශනය අධ්‍යනය කිරීමේදී දැකිය හැකි විශේෂ කරුණ නම් හටගෙන අති සෑම දේශපාලන ගැටලුවක් සඳහාම විසඳුම එහි මූලය නිවැරදි කිරීමෙන් ලබා දී ඇති බව පෙනියාම ය. එම නිසා කුමන හෝ දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තරයෙන් පැමිණෙන බලවේගයන් හෝ බලපෑම්වලට ඉතා ශක්තිමත් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට මුහුණු දීමට අති ප්‍රබල හා දැවැන්ත දේශපාලන ප්‍රතිපත්තියක් හා දර්ශනයක් ඒ තුළ ගැබ්වී ඇති බව පෙනි යයි.

එබැවින් ශ්‍රී ලංකා ජාතික ජනරජ දේශපාලන නිර්මාණය ඉදිරියට ගෙනයාම සඳහා උගත්, බුද්ධිමත් තරුණ තරුණියන් දේශපාලනයට ගෙන ඒම ඔහුගේ අරමුණයි. මේ සඳහා නිර්මාණශීලීව, කැපවීමෙන් හා අවංකව මනුෂ්‍යත්වය පෙරදැරි කරගෙන දේශපාලනයේ යෙදීමට කැමති තරුණ තරුණියන්යන්ට දැන් අවස්ථාව ලැබී ඇත. ඒ සඳහා අදම ඔබගේ ඉල්ලුම්පත්‍රය **nrpofsrilanka@gmail.com** හරහා ශ්‍රේ ගුණසිංහ මහතා වෙත යොමු කරන්න.

වර්තමාන (2018 ඔක්තෝම්බර්) දේශපාලන අර්බුදය ජනාධිපති හා පාර්ලිමේන්තුව අතර 19 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇතිකළ බල අරගලයකි. කෙදිනකවත් රටේ ජනාධිපති වීමට නොහැකි පක්ෂ නායකයෝ පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරති. එහි ප්‍රතිවිපාක වර්තමානයේ සියලුම පුරවැසියෝ හොඳින් බුක්ති විඳිමින් සිටිති. පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම ඉතා හොඳ දේශාපාලන සංකල්පයක් වුවත් ශ්‍රී ලංකාව පාලනය කිරීමට විධායක ජනාධිපතිවරයෙකු සිටීම ඉතා උචිත බව වර්තමාන දේශපාලන අස්ථාවර භාවය හේතුවෙන් මනාව ඔප්පුකර ඇත. කවදත් ශ්‍රී ලංකාව එක් පාලකයකු යටතේ පාලනය වීමට කැමති ''රජ'' යන සංකල්පය යටතේ ගොඩනැගුණු සමාජයකි. එම නිසා ශ්‍රී ලංකාවට විධායක ජනාධිපති වරයකු සිටීම ඉතා උචිත යයි හැඟී යනු ඇත. ඔහුගේ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය ප්‍රතිපත්තියක් තිබිය යුතුය.

එදා ඒ. ඊ. ගුණසිංහයන් අධිරාජ්‍යවාදීන්ට එරෙහිව දුප්පත් අසරණ වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන්කර ලබාගත් ජයග්‍රහණ හා වර්තමාන දේශපාලන නායකයන් එවැනි ජයග්‍රහණ ජනතාවට අත්කර නොදීම ජනතාව රැවටීමෙන් හා ජනතා ඡන්දය උගසට තබා ලබාගන්නා ජයග්‍රහණ හුදෙක්ම ඔවුන්ගේ වරප්‍රසාද හා ප්‍රතිලාභ බුක්ති විඳීම සඳහාම වන අතර එම දේශපාලන සංකල්ප දෙක අතර පරතරය අනන්තයකි. මෙම පරතරය අවම කිරීමට හෝ ඉවත් කිරීමට ශ්‍රේ ගුණසිංහ මහතා කළ යුතු කාර්යභාරය ඉතා සංකීර්ණය. ඒ සඳහා සැලසුම් හා ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂයේ අරමුණු ඉටුකර ගැනීමේ යෝජනාවලියෙන් හා නිර්මාත්‍ය ලිපියෙන් අදහස් ඉදිරිපත් කර ඇත. මේ සඳහා සියලුම ශ්‍රී ලාංකිය පුරවැසියන්ටද රට ස්ථාවරව සංවර්ධනය කර රටේ සියලුම ජනතාවට එහි ප්‍රතිලාභ සමාන අයුරින් ගලායාමට යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට **www.slnrp.com** වෙබ් අඩවිය මගින් අවස්ථාව ලබා දී ඇත.

## ඒ. ඊ. ගුණසිංහයන්ගේ දේශපාලන ආගමනයේ මතක සටහන්

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති සමයේ කම්කරු සටන් අරගලවල පෙරමුණේ සිටි ප්‍රබල කම්කරු නායකයෙකු ලෙස ඒ. ඊ. ගුණසිංහ මහතා ඉතිහාසගත වී ඇත.

1890 මහනුවරදී මෙලොව එළිය දුටු ඇලෙක්සැන්ඩර් ඒකනායක ගුණසිංහ මහතා අධ්‍යාපනය ලබා ඇත්තේ මහනුවර ධර්මරාජ විද්‍යාලයෙනි. පාසල් වියේදීම සමාජ වගකීම් පිළිබඳව පෙනී සිටිමින් පාසල් සමිති සමාගම් වලට සම්බන්ධව ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටුකළ ඔහු 1910 දුම්රිය දෙපාර්තමේන්තුවේ ලිපිකරුවකු ලෙස සේවයට බැඳෙමින් කොළඹට පැමිණියේය. ඉක්බිතිව පුවත්පත් වාර්තාකරුවෙකු බවට පත්වූ ඔහු සමාජ ආර්ථික ප්‍රශ්න විග්‍රහ කරමින් පුවත්පත්වල ලිපි පළ කළේය.

1915 පමණ වනවිට දේශාභිමානී පක්ෂ සහ තරුණ සංවිධාන තුළින් මධ්‍යම පන්තික දේශපාලන ක්‍රියාධරයින් බිහිවූ අතර පසුකාලීනව කම්කරු අරගල මෙන්ම ජාතික නිදහස් අරගලයේ ප්‍රමුඛ නායකයෙකු වූ සීඑම්යූ සංගමයේ නිර්මාතෘ ඒ. ඊ. ගුණසිංහ මහතාද එලෙස බිහිවූ නායකයෙකි.

1911 දෙහිවල තරුණ සංගමයක් පිහිටුවා ගනිමින් එමගින් සමාජ දේශපාලනික ගැටලු සාකච්ඡා කිරීමට අවස්ථාව උදාකරගත් ඔහු 1913 දී ලංකා සේවක සංගමය නමින් සමාජ සේවා ආයතනයක් පිහිටුවා ගත්තේය.

1914 දී සාහිත්‍ය සමිති ඒකාබද්ධ සංගමයේ ලේකම් තනතුර ද, ලංකා ජාතික සංගමයේ සාමාජිකත්වයද ලබාගත් ඔහු පසුව එම සංවිධාන අධිරාජ්‍යවාදයට පක්ෂග්‍රාහීව කටයුතු කළ බැවින් ඒවායින් ඉවත්ව 1915 දී ලංකා තරුණ සංගමය පිහිටුවීමට ප්‍රමුඛව කටයුතු කළේය.

මෙකල රජයේ සහ පෞද්ගලික අංශයේ දෛනික වැටුප් ලබන කම්කරුවන් දිනකට පැය 9 ක් සහ සෙනසුරාදා පැය 7 ක් වශයෙන් සතියකට පැය 52 ක සේවාකාලයක් සේවය කළයුතු විය.

1919 රහසිගතව ආරම්භකල රජයේ ලිපිකරු සේවක සංගමය විසින් වරාය, දුම්රිය කර්මාන්තශාලා ආදියෙහි කරන ලද අරගල හේතුවෙන් දිනකට පැය 8 සේවය සහ සතියට පැය 48 සේවය දිනාගැනීමට හැකිවිය.

1920 සර් පොන්නම්බලම් අරුණාචලම් ආරම්භකළ ලංකා කම්කරු ෆෙඩරේෂණයට සම්බන්ධ වූ ඒ. ඊ. ගුණසිංහ මහතා එම වසරේදීම සහල් මිල ඉහළ යෑම හේතුවෙන් වැටුප් වැඩිකිරීමක් ඉල්ලා දුම්රිය සහ වරාය කම්කරුවන් ගෙනගිය අරගලයට නායකත්වය දුන්නේය.

1922 ඒ. ඊ. ගුණසිංහයන් විසින් වික්ටර් කොරයාගේද සහායෙන් ලංකා කම්කරු සංගමය ගොඩනැගීම කම්කරු පංති ව්‍යාපාරයේ සංවිධානාත්මක ආරම්භය විය.

1923 පෙබරවාරි මාසයේ අරම්භකළ දුම්රිය සේවකයින්ගේ ලෙඩ නිවාඩු අහෝසි කිරීමට එරෙහි වැඩ වර්ජනය ඒ. ඊ. ගුණසිංහයන්ගේ නායකත්වයෙන් යුත් ලංකා කම්කරු සංගමය මෙහෙයවන ලද ප්‍රථම වැඩවර්ජනය යි. පසුව වැටුප් වැඩිකිරීමක්ද ඉල්ලමින් කොළඹ වරාය, කොළඹ නගර සභාව, වැල්ලවත්ත රෙදිමෝල සහ රජයේ කර්මාන්ත ශාලාව ආදී රජයේ සහ සමාගම්වල

වෙනත් වෘත්තීය සමිතිද එයට එකතුවිය. 25,000 කට අධික කම්කරුවන් සහභාගීවූ මාස 2 ක පමණ කාලයක් පැවති එම වැඩවර්ජනය ජයග්‍රාහීව අවසන් කළ අතර බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා විසින් පත්කරන ලද කොමිසමක් මගින් 20% ක වැටුප් වැඩිකිරීමක් සහ අනියම් හා ලෙඩ නිවාඩු දිනාගන්නා ලදී.

එසේම තීරණ ගැනීමේ ජනතා අයිතිය, සර්වජන ඡන්ද බලය ආදී මානව අයිතිවාසිකම් පිළිබඳව ජනතාව දැනුවත්වීමත්, පොලීසිය සහ පාලකයින් වෘත්තීය සමිතියක් කුමන ආකාරදැයි හඳුනා ගැනීමත්, වෘත්තීය සමිති ක්‍රියාවන් කිරීමට සේවකයින්ට ඇති හැකියාව උරගා බැලීමත් මෙම වැඩ වර්ජනයෙන් ලැබූ මිලකළ නොහැකි ප්‍රතිඵල වේ.

1927 වැටුප් වැඩිකිරීම සහ දිවා ආහාර විවේකය ඉල්ලා කොළඹ වරාය කම්කරුවන්ගේ වැඩවර්ජනය, 1929 කොළඹ ට්‍රෑම්රථ සේවකයින් වැටුප් සම්බන්ධයෙන් කළ වැඩවර්ජනය ආදිය ඒ. ඊ. ගුණසිංහයන්ගේ නායකත්වයෙන් සිදුකළ සාර්ථක අරගල විය.

1927 ශ්‍රී ලංකාවේ ප්‍රථම මැයිදින සැමරුම පැවැත්වූයේ ඒ. ඊ. ගුණසිංහයන්ගේ නායකත්වයෙන් යුතු වෘත්තීය සමිති ඒකාබද්ධව ගොඩනැගූ සමස්ත ලංකා වෘත්තීය සමිති කොන්ග්‍රසය විසිනි.

1928 ශ්‍රී ලංකාවේ ප්‍රථම කම්කරු පක්ෂය වූ ලංකා කම්කරු පක්ෂය ආරම්භ කරන ලද්දේ ද, ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ ලිපිකරුවන් සඳහා වූ ප්‍රථම වෘත්තීය සමිතිය වන ලංකා වෙළඳ සේවක සංගමය හෙවත් සීඑම්යූ ආරම්භ කරන ලද්දේ ද ඒ. ඊ. ගුණසිංහයන් විසිනි.

එම සියවසේ මුල් කාලයේ දේශීය ධනපතියන් ගොඩනගා තිබූ ලංකා ජාතික සංගමය විසින් එවකට උසස්යැයි සම්මතව පැවති කුලවලට පමණක් ඡන්ද බලය ඉල්ලා සිටි අතර රටේ සියලු ජනතාව සඳහා සර්වජන ඡන්දබලය ඉල්ලා සිටින ලද්දේ ඒ. ඊ. ගුණසිංහයන් විසිනි. පසුව ඒ. ඊ. ගුණසිංහයන්ගේ එම ඉල්ලීම මත බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂයේ මැදිහත් වීමෙන් 1928 ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය ලැබුණු නමුත් එය මෙරට ක්‍රියාත්මක වූයේ 1931 දීය.

1929 ඒ. ඊ. ගුණසිංහයන්ගේ නායකත්වයෙන් ඇරඹුණු ට්‍රෑම්රථ සේවයින්ගේ වැඩවර්ජනයට වරාය සහ දුම්රිය සේවකයින්ද එක්වීම හේතුවෙන් එය මර්දනයට පොලීසිය කැඳවීම නිසා ඇති වූ ගැටුම්කාරී තත්ත්වය අතරතුර ඒ. ඊ. ගුණසිංහයන් අත්අඩංගුවට ගත් බවට රාවයක් පැතිර ගියේය. එයින් කැළඹුණු ඒ. ඊ. ගුණසිංහයන්ගේ සමස්ත ලංකා වෘත්තීය සමිති කොන්ග්‍රසයට අයත් සියලු වෘත්තීය සමිතිවල සාමාජිකයින් උද්ඝෝෂණය කළ බැවින් කොළඹ නගරයේ වැඩකටයුතු සියල්ල ඇනහිටියේ ය. එය මර්දනයට රජය ගත් පියවර අසාර්ථක වූ බැවින් ජනතාව සන්සුන්කර දෙනමෙන් රජය ඒ. ඊ. ගුණසිංහයන්ට ආයාචනය කිරීමෙන් අනතුරුව ඒ. ඊ. ගුණසිංහයන් ජනතාව ඇමතීමෙන් කැරැල්ල නිමාවිය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ඒ. ඊ. ගුණසිංහයන් සමඟ එක්ව ප්‍රශ්න විසඳාගත යුතුබව අවබෝධ කරගත් හාම්පුත්තු 1929 දීම සමස්ත ලංකා වෘත්තීය සමිති කොන්ග්‍රසය නියෝජනය කළ සියලු වෘත්තීය සමිති හා සේව්‍ය සම්මේලනය අතර ප්‍රථම සාමූහික ගිවිසුම අත්සන් කරන ලදී.

1931 සහ 1936 මැතිවරණයන්ට, මැද කොළඹ ආසනය වෙනුවෙන් ලංකා කම්කරු පක්ෂයෙන් ඉදිරිපත් වී රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්වූ ඒ. ඊ. ගුණසිංහයන් 1940 කොළඹ නගර සභාවට තේරී පත්වී 1943 කොළඹ නගර සභාවේ ප්‍රථම ශ්‍රී ලාංකිය නගරාධිපතිවරයා ලෙසද තේරී පත්විය.

1947 පාර්ලිමේන්තු මැතිවරණයේදී මැද කොළඹ බහු ආසනය සඳහා ලංකා කම්කරු පක්ෂයෙන් ඉදිරිපත් වී ප්‍රථම ස්ථානය ලබා තේරිපත් වූ ඒ. ඊ. ගුණසිංහයන් ඩී. එස්. සේනානායක අගමැති වූ පළමු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ නියෝජ්‍ය කම්කරු ඇමති ලෙස පත්විය.

ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ පියා ලෙස සලකන ඒ. ඊ. ගුණසිංහයන් 1967 අගෝස්තු 01 දින මිය ගියේය.

ඒ. ඊ. ගුණසිංහයන් මෙරට වැඩකරන ජනතාව වෙනුවෙන් කළ අමිල මෙහෙය වෙනුවෙන් 1969 දී ඔහුගේ රුව රැගත් සමරු මුද්දරයක් නිකුත් කළ අතර 1989 රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා විසින් ඒ. ඊ. ගුණසිංහයන් ඔහුගේ වෘත්තීය සමිති සහ දේශපාලන රැස්වීම් වෙනුවෙන් භාවිත කළ පිටකොටුවේ ප්‍රයිස්පාක් ක්‍රීඩාංගණය සහ අවට ප්‍රදේශය ඒ. ඊ. ගුණසිංහ පුරය ලෙස නම්කර එහි පිළිරුවක්ද නිර්මාණය කරවන ලදී.

**සීඑම්යූ සංගමය බිහිවීම**

1920 ගණන්වල ඇතිවූ ආර්ථික අවපාතය සහ දේශපාලන පෙරළි හේතුවෙන් ඇති වූ කම්කරු නැගිටීම් නිසා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කම්කරු කොටස් ඒ. ඊ. ගුණසිංහයන්ගේ ලංකා කම්කරු සංගමය තුළද, රාජ්‍ය අංශයේ ලිපිකරුවන් රජයේ ලිපිකරු සේවා සංගමය තුළද සංවිධානගත වී සිටි නමුත් පෞද්ගලික අංශයේ ලිපිකරුවන් වෙනුවෙන් සංවිධානයක් නොමැතිවිය. ඔවුන්ද හාම්පුතුන් වෙතින් සූරාකෑමට ලක්ව පීඩනයට පත්වී සිටියද ඔවුන් කම්කරුවන්ගේ පාලකයින් වශයෙන් රාජකාරි කිරීම නිසා කම්කරුවන් සමග එකම වෘත්තීය සමිතියක බැඳී සිටීමට අකමැති විය.

මෙම තත්ත්වය වටහාගත් ඒ. ඊ. ගුණසිංහයන් පෞද්ගලික අංශයේ කම්කරුවන් නොවන ශ්‍රමිකයින් වූ ලිපිකාර සහ සමසේවා සේවක කොටස් වෙනුවෙන් 1928 දී ඔහුගේ නායකත්වය යටතේ ලංකා වෙළඳ සේවක සංගමය හෙවත් සීඑම්යූ සංගමය ආරම්භ කරන ලදී. එයද ඒ. ඊ. ගුණසිංහයන්ගේ සමස්ත ලංකා වෘත්තීය සමිති කොන්ග්‍රසය යටතේ ක්‍රියාත්මක විය. 1936 මාර්තු 18 දින වෘත්තීය සමිති ආඥා පනත යටතේ ශ්‍රී ලංකාවේ 14 වන වෘත්තීය සමිතිය ලෙස සීඑම්යූ ව ලියාපදිංචි කරන ලදී.

දෙවන ලෝක යුද සමයේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් වැඩවර්ජන වැළැක්වීම පිණිස අත්‍යවශ්‍ය සේවා රෙගුලාසි බලාත්මක කරන ලදී. එනමුත් සේවකයින්ගේ දුක්ගැනවිලි වෙනුවෙන් අනිවාර්ය බේරුම්කරණයකට යොමුකිරීම වැනි නීතිමය ක්‍රමවේදයන් ස්ථාපිත කරන ලදී.

1944 යුද්ධයේ අවසාන කාලයේදී ඒ. ඊ. ගුණසිංහයන් විසින් එම නීතිමය ක්‍රමවේදයන් සීඑම්යූ සාමාජිකයින් වෙනුවෙන් ලබා දිය යුතු බවට සමාගම් වලින් ඉල්ලීම් කරන ලදී. සමාගම් එය

ප්‍රතික්ෂේප කළ බැවින් ඔහු එම ආරවුල සම්බන්ධයෙන් එවකට පැවති නීතිමට තත්ත්වය අනුව අනිවාර්ය බේරුම්කරණයට යොමු කරන ලදී.

1945 දී ඒ සම්බන්ධයෙන් රජය විසින් පත් කරන ලද ජෝජ් ස්ටුවර්ට් විනිශ්චය සභාව විසින් ලබාදුන් තීන්දුව අනුව යුද සමයේ පැනවූ අත්‍යවශ්‍ය සේවා රෙගුලාසි යටතේ රජය විසින් ලබාදුන් සේවා කොන්දේසි එවකට ප්‍රධාන බ්‍රිතාන්‍ය වෙළඳ සමාගම් 14 ක සේවය කළ සීඑම්යූ සාමාජිකයින්ට ලබා දීමට නියෝග කරන ලදී. එමගින් සීඑම්යූ සාමාජිකයින්ට ප්‍රමිතිගත සේවා නියමයන් හා කොන්දේසි ලබාගත හැකිවිය.

ඒ යටතේ පොදුවේ අවම ආරම්භක මාසික වැටුප ලෙස රු.50/- ක් සහ ජීවන වියදම් දීමනාවක් දිනාගන්නා ලදී. එය සීඑම්යූ සංගමයේ ප්‍රථම ජයග්‍රහණයයි.

එම ජයග්‍රහණයන් හේතුවෙන් විශේෂයෙන් එම සමාගම්වල අනෙකුත් සේවකියින් සංගමයට බැඳීම නිසා සංගමයේ සාමාජිකත්වය වැඩි විය.

1945 න් පසු රජය විසින් එක් එක් කර්මාන්තයන් සඳහා වෙන වෙනම සේවා නියාමනයන් සහ කොන්දේසි ඇති කරන ලද නමුත් එයට වැඩකරන වෙලාව, අතිකාල, විශ්‍රාම ගැන්වීම, උසස්වීම්, සේවක සංඛ්‍යාව, වෛද්‍ය පහසුකම්, බෝනස්, දීමනා, සේවා ගාස්තු ආදී සේව්‍යයන් විසින් සේවකයින්ට ලබාදිය යුතු දීමනා සහ පහසුකම් ඇතුළත් නොකළ බැවින් එම කරුණු වලදී සේව්‍යයන්ට ඔවුන්ගේ අභිමතය පරිදි කටයුතු කිරීමට එමගින් අවස්ථාව ලැබුණි.

---

CMU-90 (1928-2018) ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී.

## ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
## Sri Lanka National Republican Party
## (SLNRP)

### ශ්‍රී ලංකාව තුළ පළාත් හා දිස්ත්‍රික්ක මායිම් ස්ථාපනය කිරීම

කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණය යටතේ වර්ෂ 1833 ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදන ලදී. එනම් දකුණු පළාත, බස්නාහිර පළාත , උතුරු පළාත, මධ්‍යම පළාත හා නැගෙනහිර පළාත වශයෙනි.

1. ඒ අනුව ගාල්ල, තංගල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක හා සබරගමු දිසාව හතර කෝරළේ, පහළ ඌව හා වෙල්ලස්ස පළාත් දකුණු පළාතට ඇතුළත් විය.
2. කොළඹ, කළුතර, හලාවත, පුත්තලම දිස්ත්‍රික්ක හා හත් කෝරළේ බස්නාහිර පළාතට ඇතුළත් විය.
3. උතුරු පළාත සඳහා යාපනය, මන්නාරම හා වන්නි දිස්ත්‍රික්කද, නුවර කලාවී දිසාව හා ඩෙල්ෆ් දූපත ඇතුළත් විය.
4. මධ්‍යම පළාත සඳහා නුවර දිස්ත්‍රික්කය හා යටිනුවර, උඩුනුවර, හාරිස්පත්තුව, තුම්පනේ, දුම්බර, හේවාහැට, කොත්මලේ, ඉහළ බුලත්ගම හා වියළුව ද, ඌව හා මාතලේ දිසාවන් හා උඩ පළාතට ඇතුළත් විය.
5. නැගෙනහිර පළාත සඳහා ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්ක හා තමන්කඩුව හා බිම්තැන්න අයත් විය.

මේ අනුව පළාත් හා දිස්ත්‍රික්ක රට තුළ හඳුන්වා දීම කරන ලදී.

වර්ෂ 1845 දී පෙර පිහිටවනු ලැබූ පළාත් මායිම් හා දිස්ත්‍රික් මායිම් වෙනස් කරමින් වයඹ හයවන (6) පළාත ලෙස පිහිටුවන ලදී. එහි පුත්තලම ප්‍රධාන නගරය ලෙස හඳුන්වනු ලැබීය. මෙහිදී පෙර හැඳින් වූ බස්නාහිර පළාතෙන් පුත්තලම හා හලාවත ද, හත්වන කෝරළේ දිසාව ද, වයඹ පළාත පිහිටුවීමේදී එකතු කරන ලදී. එමෙන්ම පෙර පිහිටවනු ලැබූ දකුණු පළාතෙන් රත්නපුර දිස්ත්‍රික්කය බස්නාහිර පළාතට එකතු කරන ලදී.

ශ්‍රී ලංකාවේ හත්වන (7) පළාත ලෙස උතුරු මැද පළාත වර්ෂ 1873 දී පිහිටුවන ලදී. එහිදී පෙර උතුරු පළාත පිහිටුවීමේදී එකතු කරන ලද නුවරකලාවී දිසාව, නැගෙනහිර පළාතෙන් තමන්කඩුවද, උතුරු මැද දිස්ත්‍රික්කයද, උතුරු මැද පළාත පිහිටුවීම සඳහා එකතු කරන ලද අතර දෙමළහත්පත්තුව නැවත වයඹ පළාත පිහිටු වීමට එකතු කරන ලදී.

වර්ෂ 1886 දී අටවන (8) පළාත ලෙස ඌව පළාත පිහිටු වීමට මධ්‍යම පළාතෙන් බදුල්ල දිස්ත්‍රික්කය ඉවත්කර ඌව පළාත පිහිටු වීමට එකතු කරන ලදී.

වර්ෂ 1889 දී නවවන (9) පළාත ලෙස සබරගමුව පළාත පිහිටු වීමට බස්නාහිර පළාතෙන් කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක එකතු කරන ලදී.

ඉහත සෑම පළාතකටම රජයේ නියෝජිත වරයෙකු (GA) පත්කරනු ලැබූ අතර දිස්ත්‍රික්ක සඳහා සහකාර රජයේ නියෝජිත (AGA) වරයකු එම දිස්ත්‍රික්කවල ආදායම එකතු කිරීම සඳහා පත්කරනු ලැබීය. සෑම සහකාර රාජ්‍ය නියෝජිතයකුම පළාතේ රාජ්‍ය නියෝජිතවරයාට වගකිව යුතු වේ. මෙම ක්‍රමය 1955 දක්වා ක්‍රියාත්මක වූ අතර එය බලගැන්වනු ලැබුවේ 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික් පනත මගිනි. ඒ අනුව දිස්ත්‍රික්ක 20 ක් එවිට පිහිටුවා තිබූ අතර හැම දිස්ත්‍රික්කයක්ම රාජ්‍ය නියෝජිත (GA) වරයෙකුගේ යටතේ පාලනය විය.

වර්ෂ 1958 සිට 1984 කාලය තුළ අලුතින් දිස්ත්‍රික්ක පහක් පිහිටවනු ලැබීය. එනම් පිළිවෙලින් වර්ෂ 1959 දී මොනරාගල දිස්ත්‍රික්කයද, 1961 දී අම්පාර දිස්ත්‍රික්කයද, 1978 දී ගම්පහ දිස්ත්‍රික්කය හා මුලතිව් දිස්ත්‍රික්කයද, 1984 දී කිළිනොච්චිය දිස්ත්‍රික්කය ද පිහිටුවීමෙන් වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික්ක 25 ක් හා පළාත් 9 ට රටේ මායිම් බෙදා වෙන්කර රාජ්‍ය පරිපාලන කටයුතු මෙහෙයවනු ලැබේ. ( National Atlas @ SriLanka Survey Deaprtment)

කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ ආරම්භ කරන ලද නව පළාත් හා දිස්ත්‍රික් නිර්ණයන් සමස්තයක් ලෙස ගෙන අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වෙන්නේ, එම සීමා නිර්ණයන් කන්ද උඩරට රාජාණ්ඩු පාලන සමයේ හා ලන්දේසින් විසින් නාවික ජනපදයන් හී ආදායම් එකතු කිරීම සඳහා ගොඩනගාගත් සීමා මායිම් පදනම් කරගෙන අදාළ දිස්ත්‍රික් හා පළාත් පිහිටුවනු ලැබූ බවයි. එමෙන්ම එම සීමා නිර්ණයන් කිසිම අයුරකින් රාජ්‍ය පරිපාලනය සමබරව රට පුරා විමධ්‍යගත කිරීමට හෝ විශේෂ සංවර්ධන වැඩ සටහනක් ඒ තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ගැබ්වී නොමැති බව වර්තමානයේදී ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ගැටලු අධ්‍යයනය කිරීමේදී ඉතා පැහැදිලිය.

මේ අනුව 2020 නව පළාත් හා දිස්ත්‍රික් නිර්ණය කර කෙටුම්පත් කිරීමට පෙර එය ජනතාවගේ අදහස් විමසීමට හා සංවාදයකට යොමු කරන අතර ඉන් අනතුරුව ජනතා ඡන්ද විමසීමකින් පසු ලැබෙන ප්‍රතිඵලය අනුව නව පනතක් මගින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ඇත.


ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
**Sri Lanka National Republican Party**
**(SLNRP)**

වර්තමානයේ පළාත් හා දිස්ත්‍රික්ක බෙදා රාජ්‍ය පරිපාලනය ක්‍රියාත්මක වන සිතියම




# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

**1833 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ ආදායම් හා පරිපාලන දිස්ත්‍රික්ක බෙදීම් සිතියම.**




# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## කෝල්බෲක් වාර්තා සමඟ ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ පළාත් බෙදීම් සිතියම



# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## ශ්‍රී ලංකාවේ උඩරට රාජධානි සමයේ පළාත් බෙදීම් සිතියම



# ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය
# Sri Lanka National Republican Party
## (SLNRP)

## ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය විචාරණය කිරීම තුළින් අවධානය යොමුකළ දේශපාලන, ආර්ථික, සමාජීය ගැටලු

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සිට වර්තමානය දක්වා විකාශනය වූ පළාත් හා දිස්ත්‍රික් මායිම් නිර්ණය කිරීම හා අදාළ වකවානු තුළදී රාජ්‍ය පාලනය සිදු වූ ආකාරය හා එම ක්‍රමයන් සඳහා ජනතාව දැක්වූ අනුකූලතාව හෝ ව්‍යාකූල තත්ත්වයන් ඇති වූ හේතූන් හා රටේ ආර්ථිකය අදාළ වකවානු තුළ හැසිරුණු ආකාරය ඈත ඉතිහාසයේ සිට වර්තමාන පාලනය දක්වා පැවත ආ ආකාරය විචාරණය කිරීම මුලින්ම සිදුකර ඇත.

1. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය.

රජුගේ පාලන යුගයන් තුළ රාජ්‍ය පාලනය, රාජධානි, පරසතුරු ආක්‍රමණ, ජන ජීවිතය, කෘෂිකර්මය, ආර්ථිකය, සමාජීය හා දේශපාලන ක්‍රමය, විදේශ ආක්‍රමණයන්ට බලපෑ සාධක, රාජ්‍ය සංවර්ධන සැලසුම්, රාජ්‍ය පරිපාලනය සඳහා රට බෙදී තිබූ ආකාරය, විදේශ  බලපෑම් වර්තමානය දක්වා ඇති වූ ආකාරය මෙහිදී අවධානයට යොමුකර ඇත.

2. ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගය.

ක්‍රි:ව 1505 පෘතුගීසි ආක්‍රමණය, ක්‍රි:ව 1658 ලන්දේසි ආක්‍රමණය, ක්‍රි:ව 1796 ඉංග්‍රීසි ආක්‍රමණය, ක්‍රි:ව 1815 කන්ද උඩරට ආක්‍රමණයෙන් පසු මුළු දිවයිනම ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වීම, රජුගේ පාලන ක්‍රමය අවසන් වීම, අධිරාජ්‍යවාදීන්ගේ වාණිජ පරමාර්ථයන් මත රට තුළ නව නගර, පාලම්, මංමාවත්, රේල් පාරවල් ඉදිකිරීම හා ක්‍රි:ව 1839 කොළඹ ශ්‍රී ලංකාවේ අගනුවර බවට පත්වීම. ශ්‍රී ලංකාවේ පැවති සිංහල හා බෞද්ධ සංස්කෘතිය විනාශ වීම, අධිරාජ්‍යවාදී පාලන යුගයේදී රජ දවසේ සිට ලංකාවට වෙළඳාම සඳහා පැමිණි මුස්ලිම් ජාතිකයන් වාසය කළ භූමි හා දකුණු ඉන්දියාවේ සිට ලංකාවට සංක්‍රමණය වූ ද්‍රවිඩ ජනතාව වාසය කළ භූමි ඔවුන්ගේ නිජබිම වශයෙන් තහවුරු කර ගැනීමෙ ප්‍රයත්නයන් හා වතු වගාව සඳහා ලංකාවට ගෙන ආ ද්‍රවිඩ ජාතිකයින් කඳුකරයේ පදිංචි කර වීම තුළින් ශ්‍රී ලංකාවේ ඇති වූ සමාජීය, ආර්ථික හා දේශපාලන පරිවර්තනය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ ආභාසය ශ්‍රී ලංකා රාජ්‍ය පාලනය සඳහා දේශපාලන වශයෙන් ආදේශ කිරීම තුළින් හා ඔවුන්ගේ දේශපාලන අරමුණු ඉටුකර ගැනීමට යොදාගත් උපක්‍රම හේතුවෙන් ශ්‍රී ලාංකිය ජන සමාජයේ  ජාති, පංති, ආගමික බෙදීම් හා යටත් විජිතකරණය තුළින් ශ්‍රී ලාංකිය ජන සමාජයේ ඇති වූ ආර්ථික, අධ්‍යාපනික, මානසික, සාමාජීය, ආගමික, දේශපාලනික ගති පැවතුම්වල පරිවර්තනය නිසා ඇති වූ සමස්ත ක්‍රියාවලියේ වර්තමාන විකාශනය, හා රාජ්‍ය පරිපාලනය සඳහා රටේ පළාත් හා දිස්ත්‍රික් මායිම් නිර්මාණය වීම.

3. i. ක්‍රි:ව 1948 දී ශ්‍රී ලංකාව යටත් විජිතකරණයෙන් මිදී බ්‍රිතාන්‍ය රැජිණට යටත්ව ගෙන ගිය රාජ්‍ය පාලනයේ ඇති වූ අර්බුද, යටත් විජිත ආභාසය හේතුවෙන් එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික, ආගමික, පංති වශයෙන් රාජ්‍ය පාලනය සඳහා කළ බලපෑම්, ජාතික විමුක්තිය සඳහා බිහි වූ දේශපාලන පක්ෂ.

3. ii. ක්‍රි:ව 1972 සම්පූර්ණයෙන්ම බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් ශ්‍රී ලංකාව මිදී ස්වයං රාජ්‍ය පාලනයක් ඇති කිරීමේදී යටත් විජිතකරණය තුළ ජාතීන් වශයෙන් ද්‍රවිඩ හා මුස්ලිම් ජාතීන්ගේ දේශපාලනික අයිතිවාසිකම් තහවුරු නොවීම තුළින් සුළු ජාතීන් වශයෙන් රාජ්‍ය පාලනයට කළ බලපෑම් හා එම නිසා ශ්‍රී ලංකාවේ දේශපාලනික, ආර්ථික හා සාමාජීය වශයෙන් පොදු ජනතාව තවමත් මුහුණ දෙන දේශපාලනික අස්ථාවර භාවය නිසා ඇති වී තිබෙන ආර්ථික පසුබෑම හා දිළිඳු භාවය. රාජ්‍ය පරිපාලනය සඳහා අවසාන වශයෙන් රට බෙදා තිබුණු ආකාරය හා ජාතික සංවර්ධනය.

3. iii. ක්‍රි:ව 1978 න් පසු විවෘත ආර්ථිකය හේතුවෙන් ශ්‍රී ලංකාව මුහුණ දුන් ලෝක ආර්ථික බලපෑම්. ක්‍රි:ව 1988 පළාත් සභා ක්‍රමය ක්‍රි:ව 1978 ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් ක්‍රියාත්මක වීම, ක්‍රි:ව 1978 න් පසු රට තුළ ඇති වූ ආර්ථික, සාමාජීය හා දේශපාලන පරිවර්තනය. පවුල් පිටින් ගෝලීයකරණයට හසුවීම නිසා මනුෂ්‍යයන් තුළ පැවති එකමුතුකම, ඥාති සම්බන්ධකම් දුරස් වී වේගවත් ආර්ථික ක්‍රියාවලියකට හසුවීම. ජාතික හා ආගමික වශයෙන් මිනිසා තුළ පවතින විවිධත්වය හා පළාත් සභා මට්ටමෙන් බලය විමධ්‍යගත කිරීම.

3. iv. වර්තමානයේ ශ්‍රී ලංකාව පළාත් හා දිස්ත්‍රික් වශයෙන් මායිම් බෙදී ඇති ආකාරය මගින් බහුතර ජනතාවට සිදුවන අසාධාරණය අනුව වර්තමාන පළාත් සභා ක්‍රමය අසාර්ථක උත්සාහයක් වීම. රටේ කෘෂිකාර්මික ව්‍යාපාරයට රජයෙන් ලැබෙන සහයෝගය හා කාර්මික සංවර්ධනය. විදේශ ණය, විදේශ ආධාර, විවෘත ආර්ථිකය නිසා රට තුළ ඇති වූ දූෂණ, වංචා, දරිද්‍රතාව හා අපරාධ වර්ධනය. රාජ්‍ය නොවන ආයතන ඇති වීම හා රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීම. ලෝක බැංකුව,  ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් හා මානව හිමිකම් සුරැකීමේ යෝජනා, පොදු ජනතාව මුහුණ දෙන ආර්ථික ගැටලු, දේශපාලන අස්ථාවරතාව, වර්තමාන දේශපාලන ක්‍රියාකාරිත්වය යටතේ ව්‍යාපාරිකයන් මුහුණ දෙන ගැටලු, රාජ්‍ය බදු ආදායම් හා එහි අක්‍රමවත් බව, වෙනස්වන දේශපාලන ප්‍රතිපත්ති නිසා වෙනස් වන අධ්‍යාපන ක්‍රමය හේතුවෙන් රැකියා අවස්ථා ලබා ගැනීමේදී තරුණ තරුණියන් මුහුණ දෙන ගැටලු, සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේදී වෛද්‍ය හා සුළු සේවකයන්ගේ වැඩ වර්ජන හේතුවෙන් පොදු ජනතාව මුහුණ දෙන ගැටලු, පෞද්ගලික ප්‍රවාහන ක්‍රමය හා පොදු ප්‍රවාහන ක්‍රමය රටේ ප්‍රවාහන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ඇති නොහැකියාව. ජීවත් වීමට ස්ථිර වාසස්ථානයක් නොමැතිකම නිසා හා ස්ථිර ආදායම් මාර්ගයක් ඇති කර ගැනීමට ඇති නොහැකියාව නිසා දිනෙන් දින වර්ධනය වන සමාජ ප්‍රශ්න. රටට අවශ්‍ය ආහාර රට තුළ නිෂ්පාදනය කර ගැනීමට ඇති නොහැකියාව. ආහාර මිල දිනෙන් දින ඉහළ යාම නිසා ජනතාවගේ පෝෂණ තත්ත්වය පහත වැටී දරුවන්ගේ මන්ද පෝෂණ අනුපාතය ඉහළ යාම, රාජ්‍ය පාලනය සඳහා වරින් වර සිදුවන පක්ෂ මාරුව හේතුවෙන් ස්ථාවර දර්ශනයක් හෝ ප්‍රතිපත්තියක් නොමැති රටක සිදු වන ආර්ථික, දේශපාලන, සාමාජීය

පසුබෑම හා ජනතාව මුහුණ දෙන ආර්ථික අර්බුදයන් හේතුවෙන් ජාතියේ පැවැත්මට සිදු වී ඇති අසාධාරණය හා අගතිය. විෂම ආර්ථික ප්‍රවාහයකට හසු වූ දෙමාපියන්ගේ පවුල් ඒකක බිඳී යාම හේතුවෙන් අසරණ වන දරුවන්ගේ අනාගතය සහ එමගින් සමාජයේ සිදුවන විෂමතාවන්, වර්තමානයේ සිදුවන ඡන්ද මනාප ක්‍රමය හේතුවෙන් පාර්ලිමේන්තුවට සුදුසු නියෝජිතයකු තෝරා ගැනීමට හැකි වුවත් ඡන්ද කොට්ඨාසයට නායකත්වයක් නොමැතිකම නිසා අසරණ වන ඡන්ද දායකයන් හා ඔවුන්ගේ අවශ්‍යතාවන් මගහැරී යාම. අවිධිමත් රාජ්‍ය පාලන ක්‍රමය නිසා එකිනෙකට ගැටෙන අධිකාරී බල විෂමතාව හේතුවෙන් ජනතාව මුහුණ දෙන ගැටලු හා එමගින් වංචනිකයන්ට ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට ඇති හැකියාව. රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති හා වරින්වර වෙනස් වන දේශපාලන ප්‍රතිපත්ති සමඟ ගැටීමෙන් ඇති වන මූල්‍ය අර්බුදයන්. රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකත්වය බිඳ වැටීම තුළින් වාණිජ අංශය මුහුණ දෙන ගැටලු, දිනෙන් දින වර්ධනය වන රාජ්‍ය, පෞද්ගලික හා පුද්ගල ණයගැති භාවය තුළින් කඩා වැටෙන ආර්ථික සැලසුම් හා එම වර්ධනයන්.

3. v. ක්‍රි:ව 1983 න් පසු මතු වූ ද්‍රවිඩ ජාතික විමුක්ති සංවිධාන ක්‍රියාකාරකම් හා රජයට විරුද්ධව එල්ල කළ විමුක්ති අරගල, නිසි දේශපාලන ප්‍රතිපත්තියක් හෝ දර්ශනයක් සමස්ත ශ්‍රී ලාංකිය පුරවැසියන් සඳහා ජාති භේද, ආගම් භේද වලින් තොරව වර්තමානය තෙක් රාජ්‍ය පාලනය සඳහා තේරී පත් වූ පක්ෂ මගින් ඉදිරිපත් කිරීමට නොහැකිවීම තුළින් මතු වූ LTTE බලපෑම් හා ස්වයං පාලනයක් හා නිජ භූමියක් වෙනුවෙන් ඇති වූ වර්ගවාදී අරගලය හා රාජ්‍ය අස්ථාවරත්වය. LTTE සංවිධානය ලංකා රජය සමඟ ස්වයං පාලනයක් සඳහා (භූමියක් වෙනුවෙන්) ඇති වූ යුද්ධය හා එහි වර්තමාන ප්‍රවනතාව. පවතින දිස්ත්‍රික් හා පළාත් මායිම් සඳහා රාජ්‍ය බලය විමධ්‍යගත කිරීමේදී එම පළාත් වල ජීවත්වන ජනතාවට සිදුවන අසාධාරණය. වර්තමාන රාජ්‍ය ආර්ථික අර්බුදයට මුහුණදීම සඳහා ලෝක බැංකුව ඇතුළුව විදේශ මූල්‍ය සංවිධාන මගින් ණය, සහනාධාර හා විවිධ රාජ්‍ය වලින් ලබා ගන්නා ණය පරිත්‍යාග හා ණය සහනාධාර හේතුවෙන් අනාගතයේ ශ්‍රී ලංකාව නොදැනුවත්වම යටත් විජිතකරණයට නැවත පත් වීමේ ලක්ෂණ.

3. vi. ශ්‍රී ලංකාව රජකුගේ පාලනයේ සිට අධිරාජ්‍යවාදී පාලනයට නතු වීමෙන් අනතුරුව හා නිදහස ලැබීමෙන් පසු ගෝලීයකරණය තුළ විවෘත ආර්ථිකයට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිය පුරවැසියන්ගේ අනාගතය, පවතින වර්තමාන රාජ්‍ය පරිපාලන ක්‍රමය යටතේ හුදෙක්ම ආධාර, සහනාධාර, ණය පරිත්‍යාග, ණය ආධාර හා භාණ්ඩ ආධාර මගින් යැපීම. රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය තුළින් වෙළඳ ඒකාධිකාරයක් ඇති කිරීම මගින්ද, ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධාන, ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක වෙළෙඳ සංවිධාන ඉදිරිපත් කරන වැඩසටහන් හා ඔවුන්ගේ උපදෙස් මත කටයුතු කිරීම හේතුවෙන් නැවත දැනුවත්ව හෝ නොදැනුවත්ව, කැමැත්තෙන් හෝ අකමැත්තෙන් කිසිම විරුද්ධතාවකින් තොරව නැවත යටත් විජිතකරණය සඳහා ශ්‍රී ලංකාව නතු වී ගෙන යන ලක්ෂණ වර්තමාන දේශපාලන භූමිය අධ්‍යයනය කිරීමේදී ඉතා පැහැදිලිව පෙන්නුම් කරයි. ඒ තුළ ජාතික, ආගමික , සාමාජීය වශයෙන් සංස්කෘතික පරිවර්තනයක් ඇතිවීම වැළැක්විය නොහැකි කරුණකි. ඒ අනුව ශ්‍රී ලාංකිය පුරවැසියන්ගේ බලාපොරොත්තු , සිතුම්, පැතුම් හා ගති පැවතුම්ද වෙනස් වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනතාවගේ දේශපාලන අරමුණු කුමන දිශාවකට ගමන් කරයිද?

ඉහත තත්ත්වයන් මනාව අධ්‍යයනය කරමින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම පුරවැසියන්ගේ ජාතික, ආගමික, වෘත්තීය අපේක්ෂාවන් සඳහා ගෞරවනීය පිළිගැනීමක් ලබා දී සමස්ත ශ්‍රී ලාංකිය ජනතාව ආර්ථික වශයෙන් පෝෂණය කරමින් යහපත් සමාජීය පැවැත්මක් ඇති කර රටේ දේශපාලන කටයුතු නිසි දේශපාලන ප්‍රතිපත්තියක් මගින් ශ්‍රී ලංකා භූමිය පුරා විසිරී ජීවත් වන ජනතාව සඳහා සමාන අයිතිවාසිකම් ලැබෙන ආකාරයෙන් හඳුන්වා දෙන නව පළාත් හා දිස්ත්‍රික් මායිම් තුළ පාර්ලිමේන්තුවට වගකියන, රාජ්‍ය පරිපාලන ආයතන මගින් ඈත පිටිසර ගම්මානවල වෙසෙන පවුල් ඒකකයට දනෙන පරිදි රාජ්‍ය  බලය වෙන් වෙන් වූ පළාත් සභා හරහා විමධ්‍යගත කිරීම, නව දේශපාලන දර්ශනයක් රට තුළ ඇති කර එම දේශපාලන රාමුව ඇතුළත විදේශ රාජ්‍ය සහයෝගය ලබා ගෙන ජාත්‍යන්තර, ප්‍රජා, මූල්‍ය හා වෙළෙඳ සංවිධාන වල සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගොඩනැගීමට හා එමගින් රටේ සියලුම  පුරවැසියන්ගේ අදහස්, බලාපොරොත්තු, සිතුම් පැතුම් විකසිත කිරීම තුළින් ගෝලීයකරණයේ අති ධාවන ප්‍රවාහයෙන් අපගේ ජනතාව මුදවා ගෙන ආගමික නැඹුරුවක් ඇති ඉතා සැහැල්ලු ජන ජීවිතයකට අතීතයේ මෙන් වුවද නව තාක්ෂණය උපයෝගී කර ගෙන වාසනාවන්ත ජන ජීවිතයක් ඇතිකිරීමේ අවශ්‍යතාව ඉතා තදින් වැටහුණු හෙයින් ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය (SLNRP) නිර්මාණය විය.

ඉහත තත්ත්වයන් මනාව අධ්‍යයනය කරමින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම පුරවැසියන්ගේ ජාතික, ආගමික, වෘත්තීය අපේක්ෂාවන් සඳහා ගෞරවනීය පිළිගැනීමක් ලබා දී සමස්ත ශ්‍රී ලාංකිය ජනතාව ආර්ථික වශයෙන් පෝෂණය කරමින් යහපත් සමාජීය පැවැත්මක් ඇති කර රටේ දේශපාලන කටයුතු නිසි දේශපාලන ප්‍රතිපත්තියක් මගින් ශ්‍රී ලංකා භූමිය පුරා විසිරී ජීවත් වන ජනතාව සඳහා සමාන අයිතිවාසිකම් ලැබෙන ආකාරයෙන් හඳුන්වා දෙන නව පළාත් හා දිස්ත්‍රික් මායිම් තුළ පාර්ලිමේන්තුවට වගකියන, රාජ්‍ය පරිපාලන ආයතන මගින් ඈත පිටිසර ගම්මානවල වෙසෙන පවුල් ඒකකයට දැනෙන පරිදි රාජ්‍ය  බලය වෙන් වෙන් වූ පළාත් සභා හරහා විමධ්‍යගත කිරීම, නව දේශපාලන දර්ශනයක් රට තුළ ඇති කර එම දේශපාලන රාමුව ඇතුළත විදේශ රාජ්‍ය සහයෝගය ලබා ගෙන ජාත්‍යන්තර, ප්‍රජා, මූල්‍ය හා වෙළෙඳ සංවිධාන වල සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගොඩනැගීමට හා එමගින් රටේ සියලුම  පුරවැසියන්ගේ අදහස්, බලාපොරොත්තු, සිතුම් පැතුම් විකසිත කිරීම තුළින් ගෝලීයකරණයේ අති ධාවන ප්‍රවාහයෙන් අපගේ ජනතාව මුදවා ගෙන ආගමික නැඹුරුවක් ඇති ඉතා සැහැල්ලු ජන ජීවිතයකට අතීතයේ මෙන් වුවද නව තාක්ෂණය උපයෝගී කර ගෙන වාසනාවන්ත ජන ජීවිතයක් ඇතිකිරීමේ අවශ්‍යතාව ඉතා තදින් වැටහුණු හෙයින් ශ්‍රී ලංකා ජාතික ජනරජ පක්ෂය (SLNRP) නිර්මාණය විය.

## සටහන්

## සටහන්




ශ්‍රේ ගුණසිංහ

**177/F/1, ඕපාත, කොටුගොඩ, ශ්‍රී ලංකා**

**Tel: +94 771 771 557 / 0715 648 869 / 0765 353 537**

**Email: nrpofsrilanka@gmail.com / Web: www.slnrp.com**

ISBN 978-955-71252-0-6

9 789557 125206